# 2021 නොවැම්බර් මස 05 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ

# 2021නොවැම්බර් මස මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

01. නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා
02. නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
07. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
08. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
09. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.ඩී.රන්දූ නිරෝෂණ මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්ඳු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
26. මහා නගර සභා මන්ත්‍රී - උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය

28. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
29. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා
30. මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා
31. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
32. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා
33. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
34. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිනී පීරිස් මහතා
35. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා
36. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය
37. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
38. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා
39. මහා නගර සභා මන්ත්‍රී - මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
40. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
41. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
42. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
43. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය
44. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
45. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
46. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2021.11.05 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2021.10.07 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,2021.10.07 දින සභා රැස්විම් වාර්තාව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සභා වාර්තාවේ පැන නගින කරුණක් සම්බන්ධයෙන් එදා මට ආයතන කමිටු සභාපතිවරයා හැටියට යම් දේශපාලඥයෙක් විසින් විශාල ප්‍රහාරයක් එල්ල කරනු ලැබුවා. හැබැයි ඒක මම බලාපොරොත්තු වෙනවා මේ වාර්තාව තුල හරියට අන්තර්ගත වෙයි කියලා. ඒක සංශෝධනය වෙලා තමයි වාර්තාවේ අන්තර්ගත වෙලා තියෙන්නේ ගරු නගරාධිපතිතුමනි. මම ඒ සම්බන්යෙන් යම් ක්‍රියාමාර්ගයක් ගනිමින් ඉන්නවා ඒ නිසා මට ඒ කරුණු අවශ්‍ය වෙලා තියෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ඒ අදාල ප්‍රකාශය සම්පුර්ණවම කිනම් ආකාරයකට හෝ ලබාදෙන්න කියන එක.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධයෙන් මම හිතනවා ඔබට අදාල වන්නාවූ කාරනා අවශ්‍ය පරිදි ලබාදීමේ කටයුත්ත සිදු කරන්නට පුලුවන් සභා වාර්තාවෙන් එය ඉවත් කලත් අපි ගාව හඩ පටය තියෙන නිසා

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ හඩ පටය ලැබීමට සලස්වන්න. ඒත් එක්කම ප්‍රහාර එල්ල කලේ මට හැබැයි මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ නගර සභාවේ මේ වාර්තාව නැති වෙන්නේ නැහැ දිගටම තිබෙන වාර්තාවක් ඒ නිසා අපි මන්ත්‍රීවරු හැටියට ප්‍රකාශ කරනකොට ගරු නගරාධිපතිතුමනි යම් සේවකයන්ගේ සේවිකාවන්ගේ නම් ප්‍රකාශ කරනකොට ඒක අපි බලලා ප්‍රකාශ කරන්න ඕන. මෙහි යම් සේවිකාවගේ නමක් ප්‍රකාශ වෙලා තියෙනවා. ඒක දිගටම බලපානවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා මේ සභා වාර්තාවෙන් අදාල නම ඉවත් කරන්න කියන ඉල්ලීම කරනවා මොකද හේතුව මට තමයි ගහලා තියෙන්නේ හැබැයි කවදා හරි දවසක ලොකු බලපෑමක් වෙනවා මේ නම් ඇතුලත් වෙනකොට සභා වාර්තාවේ. ඒ නිසා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා මේ සභා වාර්තාවෙන් ඒ නම ඉවත් කරලා අදාල සේවිකාව කියන වචනය සඳහන් කරන්න කියලා.

මහා නගර සභා මන්ත්‍රී එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ඉහත සංශෝධන සහිතව 2021.10.07 දින පැවති මහා සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u>

**2(1)** <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම් නායක නිශාන්ත ප්‍රදිනාන්දු මහතා. අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

**2(2)** <u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, ගරු මහ නගර සභා මන්ත්‍රී එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය අද දිනයේ අත්‍යාවශ්‍ය කරුණක් නිසා සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

**2(3)** <u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, සභාවේ පුරප්පාඩු සභික ධුරය සඳහා එම්.චන්ද්‍රා ගාමිණී පිරිස් මහතා මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත් කරගෙන ඇති බව ගැසට් නිවේදනය යටතේ දැනුම් දීලා තියෙනවා

**2(4)** <u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, ඒවගේම එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් නායක ධුරය සඳහා මහ නගර සභා මන්ත්‍රී රවිනාත් ජේ ගුණසේකර මැතිතුමාව නම් කරලා එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් විසින් ලිපියක් එවලා තියෙනවා.

**2(5)** <u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, ඒවගේම පුරප්පාඩු සභික ධුරය සඳහා තේරිපත්වූ මහ නගර සභා මන්ත්‍රී එම්.චන්ද්‍රා ගාමිණී පිරිස් මහතා කර්මාන්ත පිලිබඳ ස්ථාවර කාරක සභාවට සාමාජිකයෙකු ලෙස පත්කරනු ලබනවා.

**(මේ අවස්ථාවේ දී පුරප්පාඩු සභික ධුරය සඳහා තේරි පත් මහා නගර සභා මන්ත්‍රී එම්.චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා සභා ගර්භයේ අසුන් ගන්නා ලදි.)**

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, අපිත් සමඟ අවුරුද් 8 ක වගේ කාලයක් මේ සභාවේ කටයුතු කරපු එම්.චන්ද්‍රාගාමිනි පිරිස් සොඳුරු මිනිසා නැවත වතාවක් මන්ත්‍රී ධුරයකට පත්වෙලා අද දිනයේදි අසුන් ගැනිම සම්බන්ධව අපගේ ප්‍රසංසනීය වූ සුභාශිංසනය මේ අවස්ථාවේ පුදකරමින් එතුමාට සභාව හමුවේ වචන කිපයක් කථා කිරිමට අවස්ථාව ලබා දෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රා ගාමිණී පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමනි, විපක්ෂ නායක තුමනි, විපක්ෂයේ සංවිධායක තුමනි, නාගරික මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියලාගෙන් අවසරයි ඒවගේම නාගරික කොමසාරිස්තුමා ප්‍රමුඛ නිලධාරි මණ්ඩලයේ සියලු දෙනාගෙන්ම අවසර පතනවා. ඇත්තෙන්ම ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි මම පැමිණෙන විටදුන් ගෞරවය සහ උණුසුම් පිළිගැනීමට. ඒවගේම ගරු නගරාධිපතිතුමනි මම මේ අවස්ථාව බොහොම සතුටින් සහභාගි වෙන්න හිටපු අවස්ථාවක්. මහජන නියෝජිතයෙක් වෙලා පුරුදු පරිදි මහජනතාවට සේවය කරන්න පුදුම සතුටකින් හිටියේ.නමුත් ඉතාම කණගාටුදායක සිදුවීමක් එක්කයි මට නගර සභාවට එන්න සිදු වුනේ. හේතුව මම පලමුවෙන්ම මන්ත්‍රීවරයෙක් වෙලා 2002 එනකොට ජෝෂ්ට මන්ත්‍රීවරයෙක් විදියට ගාමිනි මන්තෙස් ගරු මන්ත්‍රීතුමා තමයි දොර ළඟ සිට මට කථා කරලා මාව බදාගෙන මට සුභ පතලා මාව ඇතුලට එක්කගෙන ආවේ.හැමදාම අපි ගමනක් යනකොට විදේශ සංචාරයකට යනකොට වුනත් එතුමා අවිල්ලා අපිට ආශිර්වාද කලේ තාත්තා කෙනෙක් සහෝදරයෙක් වගේ එහෙම පුද්ගලයෙක් නැති වුනාට පස්සේ එතුමාගේ හිස් තැන පුරවන්නට එන්න සිදුවිම දෛවෝපගත සිදුවීමක්. එතුමත් එක්ක මේ සභාවේ අසුන් ගන්න ලැබුනා නම් මම ගොඩක් සතුටු වෙනවා.

ගරු නගරාධිපතිතුමනි, මාව යෝජනා කරන්නත් පෙර නගරාධිපතිතුමා හමුවුන හැම අවස්ථාවකම එතුමා බොහොම සුහදව කථා කරන කෙනෙක්. වරෙන් වරෙන් ඉක්මනට වරෙන් අපට සභාවට අවශායි ගමට අවශායි එතුමාගේ ඒ සුහශිලි ශෛලිය එහෙමයි. ඇත්තට ඔබතුම එහෙම කථා කරපු එක අපිට ධෛර්යයක්. ඇත්තෙන්ම පසුගිය කාලය පුරාම මගේ මන්ත්‍රී ධුරය අහිමි වුනාට පසුව නගර සභාවට ආවේ නැහැ. මට මොනවා හරි දෙයක් කර ගන්න ඕන වුනත් ඔබතුමාට කථා කලා එහෙම නැත්නම් අපේ නගර සභා නිලධාරින්ට කථා කලාම ඒ අය කොයිම වෙලාවකවත්මහ ඇරියේ නැහැ මගේ මිනිසුන්ට මගේ ජනතාවට කරන්න පුලුවන් උපරිම දෙය සියලුම අංශවල කරලා දිමට සහයෝගය දැක්වුවා. මේ අවස්ථාවේදි ඒක සිහිපත් කරන්නම ඕන. ඊලඟට ගරු නගරාධිපතිතුමනි ඔබතුමාට කථා කලාම කොයිම වෙලාවකවත් මඟ ඇරියේ නැහැ. ඒක ඉටු කරලා දුන්නා. ඔබතුමා සම්බන්ධ කර ගන්නබැරි වුන වෙලාවේ උපනගරාධිපතිතුමාට කථා කලාම එතුමා බොහෝ අවස්ථාවාල බොහෝ උදවු මගේ මිනිස්සු වෙනුවෙන් කලා. ඒක මේ අවස්ථාවේදි සිහිපත් කරන්න ඕන. ඒවගේම තමයි අපේ සහෝදර මන්ත්‍රී

කණ්ඩායම බොහොම සුහදයි. විශේෂයෙන් මේ වෙලාවේ මසීනා මන්ත්‍රීතුමිය ගැන නොකිවොත් අඩුවක් මට මන්ත්‍රීධුරය නැති කාලේ එතුමියට මොනවා හරි හම්බවුනාම මට කථා කරලා කියනවා චන්ද්‍රා ගාමිණී මහත්තයා ඔයාගේ දුප්පත් කවුරුහරි ඉන්නවා නම් පොතක් හම්බවුනත් , ආහාර ද්‍රව්‍යක් හම්බවුනත් එහෙමයි අනේ කවුරු හරි එවන්න මගේ කොට්ඨාශයට හම්බ වුනේ කමක් නැහැ ඔයාගේ කට්ටියටත් දෙන්න කියලා.

ගරු නගරාධිපතිතුමනි, මම මේ සභාවට එනවට මගේ ගමේ ඇතුලු බොහෝ දෙනෙක් මගේ ප්‍රති පක්ෂයේ ඔබතුමාලා වෙනත් පක්ෂයේ වුනත් සියලු දෙනා මට සුභ පැතුවා. බොහොම ගෞරවයෙන් සුභ පැතුවා මගේ කණ්ඩායමත් එහෙමයි. ගොඩක් අය සතුටු වුනා. සමහරෙක් මම එනවට කැමති නැහැ. සමහර අය බයයි.කොහෙම වුනත් මම දන්නේ නැහැ මට මේ අවස්ථාව මගේ මිනිස්සුන්ට මගේ උපන් ගමට සේවය කිරිමට ලැබිම ගැන මම සතුටු වෙනවා නැවතත් ඔබතුමාලා එක්ක එකතු වෙලා වැඩ කරන්න ලැබුනු අවස්ථාව ගැන ස්තූතිවන්ත වෙනවා. ඒවගේම අද අපේ අලුතෙන් විපක්ෂනායක කණ්ඩායම් ධූරය දරන අපේ රවිනාත් ගුණසේකර මැතිතුමා නගරාධිපතිධූරය දරන 2002 වසරේ තමයි මම මුලින්ම නාගරික මන්ත්‍රිවරයෙක් වුනේ. එදා සිට එතුමා අපට ශක්තියක් වුනා ධෛර්යක් වුනා අද අපි එක්සත් ජාතික පක්ෂය මොරටුව ආසනය නියෝජනය කරලා නාගරික මන්ත්‍රවරයෙක් වශයෙන් පත් විම ගැන සතුටු වෙනවා.ඒ වගේම අපේ අලි පෙරහැර මේ නගර සභාවට එයි කියලා මම බලාපොරොත්තු වෙනවා. මම කථා කලේ අපේ පක්ෂයට හිස් තැනක් තියෙනවා ඒ තැන ගැන කථාකලේ. නැතුව එබතුමා එලවලා ඔතනට එනවා කියලා නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ මාව මේ තත්වයට පත් කරද්දී ගරු නගරාධිපතිතුමනි අපේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුලු බොහෝ දෙනෙක් මට උදවු උපකාර කලා.මගේ සමකාලින සංවිධායක මට්ටමේ අය මට උදවු උපකාර කලා මම නිහඬව හිටියා. ඇත්තටම ගරු නගරාධිපතිතුමනි අපේ තරුණ සංවිධායක වරුන්ට උවමනා වුනා තරුණ කෙනෙක් පත් කරන්න.මුලිකව යෝජනා වුනේ ගාමිනි මන්ත්‍රීතුමාගේ පුතා බුද්ධික මත්තෙස් මැතිතුමා මගේ කිසි විරෝධතාවායක් තිබුනේ නැහැ.මම කිසිම දෙයකට ගියේ නැහැ.එතුමා පත්විම මම පෞද්ගලිකව එකඟ වුනා. නමුත් ව්‍යවස්ථානුකූල ප්‍රශ්ණයක් නිසා එතුමාට අහිමි වුනා ඒ වෙලාවේ තරුණ පිරිස මගේ ලඟටත් ලිපියක් අරගෙන ආවා පරණ කෙනෙක් එපා අලුත් කෙනෙක් ඕන කියලා මම අත්සන් කලා මාව එපා කියලා. මාව පත් කරන්න එපා කියලා අත්සන් කරපු පුද්ගලයෙක් මම. නමුත් කොහොම වුනත් පසු පෙල හා ඉදිරි පෙල කණ්ඩායම මම නිහඬව

සිටියදි මට මන්ත්‍රී ධුරය ලබා දීමේ ගෞරවය රකිනවා. ඔබතුමා ඇතුලු නගර සභාවේ ගෞරවය රකිනවා. ඒ වගේම මට අද සුභ පතන්නට පැමිණි මොරටුව එක්සත් ජාතික පක්ෂ කළමනාකරු ජගත් කුලරත්න මැතිතුමා ප්‍රමුඛ මට ශක්තියක් වෙන්නට පැමිණි සියලු දෙනාටත් මම ශක්තියක් වෙන්න හැමදාම වගේ මොරටුමුල්ල බටහිර, පුවක්අරඹ මොරටුමුල්ල ගමේ ජනතාවටත් සමස්ත මොරටුව ජනතාවටත් ස්තුතිවන්ත වෙමින් ඔබතුමාට හරි දේට මගේ සහයෝගය හිමි වෙනවා වැරදි දේට වෙනදා වගේම විරුද්ධ වෙමින් මගේ සේවය මේ මොරටුව ජනතාව වෙනුවෙන් ඉටු කරන පොරොන්දුව දෙමින් ඔබතුමාටත සියලු දෙනාටත් නැවත වතාවක් ස්තුති වන්ත වෙනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, විශේෂයෙන්ම එක පක්ෂයකට එක අවස්ථාවක් පමණක් සුභ පැතුම් එක් කරන්න එම නිසා ආණ්ඩු පක්ෂය විදියට එක් කෙනෙකුත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවට එක්කෙනෙකුත්, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් එක්කෙනෙකුත්, ජනතා විමුක්ති පෙරමුණ විදියට එක්කෙනෙකුත් සුභාශිංසන පැතුවා නම් කාලයත් අපිට එකතු කර ගන්නට පුලුවන්. ආණ්ඩු පක්ෂය වෙනුවෙන් සුභාශිංශන පතන්නට මම වැරදි යි කියලා මම විශ්වාස කරන්නේ නැහැ මේක ඔහුට පිරිනැමීම සම්බන්ධයෙන් හේතුව එකම කාලයේ එකට හඬ මෙහෙයවලා එකම කලාව ධාරාව තුල කටයුතු සුහදශීලිව මෙහෙයවමින් වචන හරඹය ඉතාමත්ම සමාජයට හරියන තැනට හරියන විදියට දෙදෙනාම මෙහෙයවුවා කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා ප්‍රදිප් ශ්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මම කියනවා ආණ්ඩු පක්ෂය වෙනුවෙන් එතුමාට සුභාශිංශන පතන්නට අවස්ථාව ලබා දෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අද දිනය ඉතාම සතුටට පත්වෙනවා අපි විශේෂයෙන්ම ඔබතුමා ඇතුලු ආණ්ඩු පක්ෂයෙන් මන්ත්‍රවරු විදියට අපේ කල්‍යාන මිත්‍ර ඉතාම දිර්ඝ කාලයක් අපි එකට වැඩ කරපු, මහජන නියෝජිතයෝ විදියටත් අපි කටයුතු කරපු අභිනව නාගරික මන්ත්‍රි චන්ද්‍රා ගාමිණි පිරිස් මැතිතුමන්ට මුලින්ම අපේ ආණ්ඩු පක්ෂයේ සුභාශිංශන පිරිනමනවා. විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕන ගරු නගරාධිපතිතුමනි ඔබතුමා මතක් කලා වගේ චන්ද්‍රා ගාමිණි කියන්නේ අපේ බොහොම ආදරය කරන සොඳුරු කලා කරුවෙක්, ඔහු දක්ෂ නිවේදකයෙක්, හඬ ශිල්පියෙක් ඒවගේම සමාජය වෙනුවෙන් මොන දේශපාලන පක්ෂයෙන් හිටියත් යමක් මිනිසුන් වෙනුවෙන් කරන්න උත්සහ කරපු වැඩ කරපු දේශපාලඥයෙක් විදියටත් අපි හදුනාගෙන හිටියා. ඒවගේම තමයි මම

හිතන්නේ එතුමාගේ කථාවේදි එතුමා කිව්වා එතුමාගේ මන්ත්‍රිධුරය ලබා ගන්න වුනත් එතුමා එහෙම ලොකුවට සටන් කලේ නැහැ කියලා. මොකද එතුමා මේ මන්ත්‍රිධුරය පමා වෙලා ලැබෙන්නෙත් එතුමාගේ යම් යම් ක්‍රියාවන් නිසා අපි දන්නවා එතුමා තමන් අවුරුදු ගානක් නියෝජනය කරපු තමන් අවුරුදු ගානක් දේශපාලනය කරපු දේශපාලන කොට්ඨාශය පවා පක්ෂය වෙනුවෙන් පරිත්‍යාග කරලා පක්ෂය ගැන විශ්වාස කරලා කටයුතු කරපු නිසා එතුමාට මන්ත්‍රධුරය අහිමි වුනා කියලා අපි හිතන්නේ. නමුත් පක්ෂය ඒ වෙලාවේ යම් තීන්දුවක හිටිය

කියලා අපි එදා දැනගන්න ලැබුනා. ලැයිස්තුවෙන් එකක් හරි ලැබුනොත් මුලින්ම දෙන්නේ චන්ද්‍රා ගාමිනි මන්ත්‍රිතුමාට කියලා නමුත් මේ දේශපාලනයේ තිබෙන හැටි වෙන්න ඇති නමුත් ඒක එතුමට ලැබුනේ නැහැ නමුත් කොහොම වුනත් දෛවය අද ඔබතුමාට යුක්තිය ඉෂ්ඨ කරලා තියෙනවා සාධාරණය ඉෂ්ඨ කරලා තියෙනවා ගරු මන්ත්‍රතුමා. ඒකට හේතුව තමයි මේ සමාජයට වඩ වඩා යහපත් මිනිස්සු මේ දේශපාලන ක්‍රියාවලියට අවශ්‍ය වෙනවා. ඒ වගේම මෙය

අවස්ථාවක් කර ගන්නවා අද විපක්ෂනායක ධුරය මේ සභාවට සහ මොරටුවට විශාල මෙහෙවරක් කරපු හිටපු නගරාධිපති රවිනාත් ජේ ගුණසේකර මැතිතුමාට හිමිවෙලා තියෙනවා. එතුමාටත් අපි ආණ්ඩු පක්ෂය විදියට සුභ පතනවා. ගරු නගරාධිපතිතුමනි නැවත වතාවක් මෙතෙක් අපි විශ්වාස කරපු දේශපාලනය වෙනුවෙන් වෙනත් දේශපාලන කඳවුරක සිට වුනත් චන්ද්‍රා ගාමිණී පිරිස් මැතිතුමා කරපු දේශපාලන වැඩ සටහන වැඩ පිලිවෙල ඉදිරියට ගෙන යන්නට ඔබට ශක්තිය, ධෛරය , වාසනාව ලැබෙවා කියලා ඉකසිතින් ප්‍රාර්ථනා කරනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් එකම එකට එකම පැත්තේ එකට හිටපු නිසා සුනිල් නන්දසිරි මාසකෝරාල මැතිතුමා ඒ අවස්ථාව ලබා දෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රි - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන්ම මතක් කරන්න ඕන කවුරුත් දන්නවා විපක්ෂ නායක වෙන්නේ මම නේ හිටියා නම් එහෙම. මම හරිම සංතෝෂ වෙනවා කවුරුත් ඒක දන්න කතාවක් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධානියා මේ වෙනකොට නගර සභාව තුල. නමුත් මම සංතෝෂ වෙන්නේ ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමාගේ ඉතාමත්ම ලඟම ඥාති පුත්‍රයා රවිනාත් ගුණසේකර මැතිතුමාට මම මුලින්ම සුභ පතනවා. බොහෝ කලක් තියෙන් තිබුන දෙයක් විපක්ෂ නායක කම ලබා ගන්නට ශක්තිය ධෛර්ය ලබා දිම තුල පක්ෂය තුලින්. ඒ

වගේම චන්ද්‍රා ගාමිණී පිරිස් මන්ත්‍රීතුමා නෝමන් රණසිංහ මැතිතුමාගේ ගෝලයෝ දෙන්නේ අපි දෙන්නම ඒ කාලයේ සිටම

යෞවන සමාජ ආරම්භයේ සිටම අපි දෙන්න එකට වැඩ කරපු දෙන්නෙක් ඒ කාලේ දේශපාලනයට පිවිසිලා නෝමන් රණසිංහ මැතිතුමාගේ අභාවයෙන් පස්සෙන් කෙසේ හෝ චන්ද්‍රා ගාමිනි මන්ත්‍රීතුමා ටික කාලයක් ඒ පෙරහැරෙන් ඉවත් වෙන්න සිද්ධ වුනා. නමුත් ඉන් අනතුරුවත් අපි දෙදෙනා වැඩ කරන්නේ මේ වෙනවිටත් එකම නගර සභාවේ සුරංග මන්ත්‍රීතුමාත්,මමත්, චන්ද්‍රා ගාමිනි පිරිස් මන්ත්‍රීතුමා දෙහිවල නගර සභාවේ ඒ නිසා අපි කවදාවත්ම ප්‍රශ්ණ ඇති වෙලා නැහැ මොනම ආකාරයකින් වත් දේශ පාලන ගැටලු ඇති වුනාට අපි හිතින්, අතින් පයින් ගහගන්න දේ ඇති වෙලා නැහැ. මම විශේෂයෙන්ම සංතෝෂ වෙනවා චන්ද්‍රා ගාමිනි පිරිස් මැතිතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් පුරප්පාඩු වුන මන්ත්‍රීධුරයට පැමිණීම සම්බන්ධයෙන් නැවතත් ස්තුතිවත්න වෙමින් ඔබගේ ඉදිරි කාලය ඒ කලාව වගේම අනිකුත් සියලු කටයුතු වගේම දේශපාලන කටයුතුත් ඉතාම හොඳින් සාර්ථක වේවා කියා ප්‍රාර්තනා කරමින් ඔබට නැවතත් සියලුම ජනතාවටත් ඒ වගේම එක්සත් ජාතික පක්ෂ නායකත්වය යටතේ සියලු කටයුතු සාර්ථක වේවා කියා සුභ ප්‍රාර්ථනා කරමින් කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. ප්‍රථමයෙන්ම චන්ද්‍ර ගාමිණී අපේ සහෝදර මන්ත්‍රතුමාට සුභ ප්‍රාර්තනා කරනවා තෙරුවන් සරණ ප්‍රාර්තනා කරනවා මේ නගර සභාවට ඇවිල්ලා මේ ජනතාවට උපරිම සේවාවක් කරන්නට ජනතාවගේ අවශ්‍යතාවයන් ඉෂ්ඨ ද්ධ කරන්නට ඔබට ශක්තිය ධෛර්‍ය වාසනාව ලැබේන්න කියලා ඊට අවශ්‍ය තුනුරුවන්ගේ ආශිර්වාදය හා දෙවියන්ගේ රැකවරණය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. අපි චන්ද්‍රා මිණී මන්ත්‍රීතුමා ගත්තම බොහෝම නිහතමානි චරිතයක්. එතුමා කවදාවත් මල්ලි කියලා කථා කරනවා මිසක් අපි උප නගරාධිපති ධූරය දරන කාලයේ උපනගරාධිපතිතුමා කියලා කට පුරා කථා කරලා බොහොම ලස්සන හිනාවකින් හැමෝටම සංග්‍රහ කරන බොහොම නිර්ව්‍යාජ චරිතයක් තමයි චන්ද්‍රා ගාමිනි කියලා කියන්නේ. එක්සත් ජාතික පක්ෂය හරියටම තෝරාගෙන තියෙනවා තමන් නියෝජනය කරන්න එවන්න ඕන කවුද කියන එක පිලිබඳව. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය ගොඩක් කාලයකින් නුවණ මෙහෙයවල කරපු දෙයක්

ඒ වගේම තව එකක් තියෙනවා විපක්ෂ නායකධූරය. මම හිතනෙන් මේ නගර සභාවේ විපක්ෂ නායකධූරය කියලා කියන්නේ බොහොම භාරදූර කාර්යයක්. අපේ ව්‍යවස්ථාවේ සඳහන් නූනත් විපක්ෂ නායක ධූරය අපි සාම්ප්‍රදායිකව පවත්වාගෙන යන තනතුරක්. ඒ තනතුරට ගෞරවාන්විත පුද්ගලයෝ එකතු වෙන්නට ඕන. අපි දැක්කා සේනක දමයන්ත මැතිතුමා ඉන්නකොටත් එතුමා හොඳට විපක්ෂනායක ධූරය දැරුවා. ඒ වගේම ගාවින් මත්තෙස් මැතිතුමා අපි හැමෝගෙන ගෞරවය ලබා ගත්තු මන්ත්‍රීවරයෙක්. ඒවගේම මම හිතන්නේ සුදුසුම කෙනාට විපක්ෂනායක ධූරය ලැබිලා තියෙනවා. හිටපු නගරාධිපතිවරයෙක් හැටියට රවිනාත් ගුණසේකර කියලා කියන්නේ කිසිම ප්‍රශ්ණයක් ඇතිකර ගත්ත නගරාධිපති වරයෙක් නොවෙයි. එතුමා ඉන්න කාල සීමාව තුල එතුමා හැමෝම එක්කම බොහොම සුහදශිලී ලීලාවෙන් කටයුතු කරා. අපි ට මතකයි අපි මේ නගර සභාවට මුලින්ම පත් වුනාට පස්සේ නගරාධිපතිවරයා මුල්ම විදේශ සංචාරයක් විදියට මෙතුමාගේ නායකත්වය තුලින් තමයි අපි ගියේ. එතුමා තමයි අපිට මඟ පෙන්නුවේ මෙහෙම කරන්න මෙහෙම කරන්න කියලා. අපිට ඒක තාම මතකයි. අපිට එතුමා තාත්තා කෙනෙක් වගේ හැම දෙයක්ම කියලා දුන්නා. ඒ මඟ පෙන්වීම ඉතාමත්ම නිරහංකාර චරිතයක් හැටියට එතුමාට තියෙන සම්බන්ධකම් ජාත්‍යාන්තර විදියට බොහොම විශාලයි ඒවා උපයෝගි කරගෙන ඒ කරපු දේවල් තාමත් මතකයි. ඒ වගේම තමයි මේ සභාව තුල එතුමාගේ හැසිරීම නිරික්ෂණය කරන කොට ඉතාමත්ම වැදගත් හැසිරීමක් ඔහු පෙන්වනවා. අනිත් සියලුම මන්ත්‍රීවරුන්ට මම කියන්නේ විශේෂයෙන්ම නවක මන්ත්‍රීවරුන්ට ලොකු ආදර්ශයක් එතුමා සපයනවා මන්ත්‍රීවරයෙක් හැටියට කොහොමද මේ සභාව තුල හැසිරෙන්න ඕන කියලා. සමහරවිට අපේ වයසේ වැරැද්දට හරි යම් යම් වැරදි කියවුනාට සභාව තුල දැඟලුවාට එතුමා කවදාවත් බොහොම පරිනත දේශපාලඥයෙක් විදියට එතුමා එතුමාගේ වැඩ කටයුතු කරගෙන යනවා. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය හුග කාලයකින් නුවණ තිබෙන වැඩ දෙකක් කරලා තියෙනවා. අ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ඔබ දෙපලටම අපි සුභ පතනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපිට එක්සත් ජාතික පක්ෂයට කථා කරන්න අවස්ථාව දෙන්න.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කිවුවත් කවුරු කිවුවත් කියන්නේ එතුමාගේ හොඳ. දැන් කරුණාකරලා ඉඳ ගන්නකෝ. ඔබතුමන්ලාගේ එක්සත් ජාතික පක්ෂය කියන එක අපි ගෞරවාන්විත විදියට පිලිගෙන මම 2002 සිට දැන් අවුරුදු 19 ක් ඉවරයි. මේ අවුරුදු 19 ටම මන්ත්‍රීවරු ඇවුමෙන් ඇවිල්ලා තියෙනවා. කවදාවත් නගරාධිපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරු නැඟිටලා ඒ එන මන්ත්‍රීවරයට ගෞරව දක්වපු පලවෙනි වතාව මේ.මීට වඩා ගෞරවයක් නැහැ එතුමට. ඒක නිසා අපි ඒක කරලා තියෙන්නේ. එතුමා වෙනුවෙන් කථා කලානේ අපි. ඔබතුමාලා කවුරු මොනවා කිව්වත් සුනිල් නන්දසිරි මාසකෝරාල මන්ත්‍රීතුමාවත්, තිසර මෙන්ඩිස් මන්ත්‍රීතුමාවත්, ලිහිනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමියවත් සලකන්න වෙන්නේ එක්සත් ජාතික පක්ෂයෙක් කියලා තමයි අපිට මෙතන වෙන මොකක්වත් සලකන්න බැහැ. ඒ නිසා කරුනාකරලා ඒක අපි ඒ විදියට කරමු.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම ප්‍රධාන පුරවැසියා විදියට මගේ සුභ පැතුම සිදු කරනවා. විශේෂයෙන් මම වැඩි යමක් කියන්නේ නැහැ. සියලු දෙනාම එතුමා වෙනුවෙන් කථා කලා. එතුමා මට මතකයි 2011 වර්ෂයේ දැනට මොරටුව මහ නගර සබාව තුල මානාප ලේඛණ වල වැඩිම ජන්ද ගන්න මැතිවරන වලදි මම සමහර තැන් වලට කිව්වා එක්සත් ජාතික පක්ෂයේ, මට මතකයි නම් දෙක එක නමක් තමයි ළදරුවන්ට මව්වරුන්ට කිරි ටික දිලා ඔවුන්ව පෝෂණය කරන්න ඕන කියලා සභාවට යෝජනාවක් ගේනවා චන්ද්‍රා ගාමිණි පිරිස් මන්ත්‍රීතුමා. ඒවගේම අනුමත නොවන පර්චස් 6 නොවෙයි පර්චස් 1 ටත් වීථි රේඛා සහතික නිකුත් කරන්න මිනිස්සුන්ට ණය ගන්න කියලා සුනිල් නන්දසිරි මන්ත්‍රීතුමා යෝජනාවක් ගේනවා. මේ මන්ත්‍රීවරු දෙන්නා මේ යෝජනා ගෙනාපු නිසා මම මගේ වේදිකාවේ කියන්න ගත්තා එක්සත් ජනතා නිදහස් සංධානයට ජන්දය දෙන්නේ නැති කවුරු හරි ඉන්නවා නම් ඒ ජන්දය වෙන කාටවත් දෙන්න එපා චන්ද්‍රා ගාමිණී පිරිස්ටයි, සුනිල් නන්දසිරි මාසකෝරාලටයි දෙන්න කියලා. අන්න ඒ මන්ත්‍රීවරයා තමයි අද මෙතනට ඇවිල්ලා ඉඳගෙන ඉන්නේ. එතුමා දන්නවා මම ඒක පුවක්ගහ තොටුපලෙත් කිවුවා ශාන්ත අන්තෝනි පාරෙත් කිව්වා, මගේ විල්ලෝරාවත්තෙත් මම ඒක කිව්වා. ඒ වගේම එතුමා ලග තිබුනේ පුදුම ඇලුම් කරන ස්වභාවයෙන් දේශපාලනය කරන්නේ. එතුමාට තරහා යන ප්‍රමාණය විශේෂයෙන්ම මම දැකල නැහැ.කොහෙම වුනත් තමන්ගේ දේශපාලන කටයුතු හැමදාම කොහොම කථා කලත් එතුමා මොකක් හෝ අලුත් දෙයක් අලුත් යමක් කලා අපේ රවිනාත් ජේ ගුණසේකර නගරාධිපතිතුමා එවකට නගරාධිපතිත්වය

දරන කාලේ මේ විනාශ වෙමින් යන තාරුණ්‍යයට මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා යන තාරුණ්‍යට විශාල වැඩ කොටසක් කරන්නට රවිනාත් ජේ ගුණසේකර මැතිතුමාට සහයෝගය දුන්නා කියන එක විවාදයක් නැහැ. එතකොට අපි විපක්ෂයේ ඉඳගෙන ඒක බැලුවා. අපි ඒක දැක්කා අපි අත්වින්දා. ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,එතුමා විපක්ෂනායක ධුරය ලබන්න තරම් එතුමා මම හිතන්නේ චන්ද්‍රා ගාමිනි පිරිස් මන්ත්‍රීතුමා වගේම විශාල වශයෙන්ම ලොකු කාල පරාසයක් බලාගෙන හිටියා කවදා හෝ සුදුසු විදියට සුදුසු තැන ලැබේවි කියලා. මම හිතන්නේ දෙදෙනාගේම ඉවසීම නිසාම දෙදෙනාට එය ගෞරවාන්විතව ලැබුනා. උදාහරණයකට ගත්තොත් අපි කුලරත්න පිරිස් ගරු මන්ත්‍රීතුමා පලමු අසුනේ ඉදගෙන ඉන්න කොට ධම්මික චන්ද්‍රනාත් මහත්මයා විපක්ෂ නායක කියලා දෙවන පුටුවේ හිටියේ. අද ඉන්න ඕන තුනවන පුටුවේ වුනාට ගෞරවයට පාත්‍ර වුන නිසා ඉද ගන්නකොටම පලවෙනි පුටුවට එන්න ලැබුනා විපක්ෂ නායක තුමාට මම හිතන්නේ ඒ මහත්මා ගුණය ඒ අතින්ම තිබුන නිසා තමයි. ගරු මන්ත්‍රීවරු දෙදෙනම මගේ ස්ථානය දෙන්න කියලා කිව්වේ. මෙන්න මේක තමයි පිදිය යුත්තන් පුදන්න ඕන වගේම ලැබිය යුතු දේවල් ලැබෙන්න ඕන අයට ලැබුනු හොඳ අවස්ථාවක් විදියට තමයි මගේ 19 වන අවුරුද්ද ගෙවී යන මේ මොහොතේ මට දැනෙන්නේ හොඳම අවස්ථාවන් දෙකක් සංකලනය වෙලා තියෙනවා.

විශේෂයෙන් චන්ද්‍රා ගාමිනි පිරිස් සොඳුරු මිනිසාට මම කියන්නේ මොකද එතුමා මයික් එකක් අතට ගත්තොත් ඒ හඩට අභියෝග කරන්න පුලුවන් හඩක් නැහැ තමන්ගේ කඩහඩ පාවිච්චි කරලා දෙබස් කැවීමට එතුමා පිලිබඳව මොරටුවේ තුල ගත්තම නමක් එතුමට තියෙනවා ඒවගේම නාට්‍ය කලාව ගත්තම ඒත් එහෙමමයි. එතුමා බොහොම කලා වේදියෙක් විදියට හැම දෙයක්ම සංවේදි වෙන්න පුලුවන් වන චරිතයක් විදියට එතුමා පත්වෙලා තියෙනවා. මොකද අපි වඩු කාර්මිකයෝ විදියට සමහර වෙලාවට අපේ යම් යම් අයව මියගිය අයව මතක් වෙනකොට අපිට ඇඩෙනවා වගේ කලාවට සම්බන්ධ වෙන්නාවු ඕනැම කෙනෙකුට සංවේදි බව වැඩි වෙනවා. සංවේදි වුන මහත්මයෙක් විදියට ඔබතුමාට තවත් දුරට අපේ සහයෝගයත් ලබාගෙන ජනතා නියෝජිතය ඉතාම හොඳින් කරන්ට ඔබට සුභාශිංශන පතනවා.

මේ අවස්ථාවේදි විපක්ෂ නායක කියන තනතුරක් නොමැති වුනාට සම්ප්‍රදායිකව පැවතිගෙන එන විපක්ෂ නායක වරයෙකුගේ වගකීම ඉතා හොඳින් කරන්නට වන ඥාණයෙන්, බුද්ධියෙන්, උගත්කමින්, අවබෝධයෙන්, දැනුමෙන් පරිනත භාවයෙන් මේ සියලුම දේ තුල මම හිතනවා මේ කණ්ඩායමේ කාටවත් අභියෝග කරන්නට බැරි වෙන්නාවු චරිතයක් බවට

හිෂන කාලයේදි කවුරුත් ඉදිරිපත් නොවන කාලයකදි පලාත් සභාවට ඉදිරිපත් වෙලා ලා බාල තරුණයෙක් විදියට ඉදිරිපත් වෙලා තමන්ගේ දේශපාලන ගමන එතනින් ආරම්භ කරලා දෙවතාවක් පලාත් සභාව නියෝජනය කරලා, නගරාධිපතිවෙලා තව දෙවතාවක් මන්ත්‍රිධුර ලබාගෙන පරිණත වෙච්ච ඒ වගේම අණපනත් පිලිබදව අවබෝධයක් ඇති කෙනෙක් විදියට ගරු රවිනාත් ගුණසේකර විපක්ෂ නායක ධුරයේ ඉද ගැනිම මම හිතනවා ධම්මික චන්ද්‍රනාත්, අනුෂ ගුණසේකර, ලසින්ත ප්‍රනාන්දු වැනි විපක්ෂ නායකයන් ගොඩට එකතු වන තවත් විපක්ෂ නායක වරයෙක් බවට ඔබතුමා පත්වෙනවා. ඒ පිලිබදවත් සුභාශිංශන පතමින් විශේෂයෙන්ම ඔබ දෙන්නාගේ ගමන් මග තෙරුවන් සරණයි චන්ද්‍රා ගාමිණි පිරිස් මහතාට ජේසු පිහිටහි විපක්ෂ නායක රවිනාත් ගුණසේකර මැතිතුමාට.

<u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජේ ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මුලින්ම සුභ ප්‍රාර්ථනා කරන්න කැමතියි මා මිත්‍ර චන්ද්‍රා ගාමිණි අලුත් මන්ත්‍රතුමාට. එතුමා මා සමඟ බොහොම කාලයක් මේ නගර සභාවේ මන්ත්‍රවරයෙක් විදියට හිටියා. ඔබතුමා ඔබතුමාගේ කථාවේ කිව්ව පරිදි විශාල සේවයක් මේ මහ නගර සභාවට කරලා තියෙනවා. විශේෂයෙන්ම එතුමා මම නගරාධිපති කාලයේදි මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහන මගින් සම්මානයක් මොරටුව මහ නගර සභාව හිමිකර ගත්තා. ඒවගේම ඒ අපි කරාවු වැඩ කටයුතු කොච්චර හොදින් කෙරුවද කියලා කිව්වොතින් ඇස්කැට් කියන ඒශියන් සිටිස් එගේන් ග්‍රග්ස් මහා දැවැන්ත සමුළුවේ පලමුවෙනි මහා සභාවේදි මම මොරටුව මහ නගර සභාව නියෝජනය කරමින් ගරු නගරාධිපතිතුමනි මම උපසභාපතිවරයෙක් වුනා. පිලිපිනයේ මැනිලා නගරාධිපති දෙවැනි උප සභාපති වුනා. ඒ තනතුර මම නගරාධිපති කාලය පුරාමත් ඊට පසුවත් අවුරුද්දක් ඒ තනතුර හෙබවුවා ඒකට විශේෂයෙන්ම ගෞරවය හිමිවෙන්නේ අපේ චන්ද්‍රා ගාමිනි පිරිස් මන්ත්‍රිතුමාට.

දෙවනුව ගරු නගරාධිපතිතුමනි අද දිනයේ මාව විපක්ෂනායක හැටියට එක්සත් ජාතික පක්ෂයෙන් මාව පත් කිරිම ගැන මම පක්ෂයේ මහ ලේකම් තුමාටත් මාව තෝරපු ඒ කමිටුවටත් මගේ නම අනුමත කලාවු අපේ පක්ෂ නායක හිටපු අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් මාගේ ස්තුතිය ප්‍රථමයෙන්ම මා පුදකරනවා. ඔබතුමා ඉතාමත්ම නිවැරදිව කිවුවා වගේ මම ඒ තනතුර ඉල්ලාගෙන කිසිම අවස්ථාවක කාටවත් කථා කෙරුවේ නැහැ. මම

බලාගෙන හිටියා සුදුසුයි කියලා හිතෙනවානම් පක්ෂය මේ තනතුර මට දිය යුතුයි. නැත්නම් ඒක වෙනත් කෙනෙකුට දියයුතුයි කියන මතයේ මම හිටියේ. එදත් හිටියේ එහෙමයි. ඒ අනුව පක්ෂය තින්දුවක් කරලා තිබුනා මේ තනතුර මට ලබා දෙන්න කියලා. මම ඒ තනතුර ඉතාමත්ම සතුටින් භාරගත්තා. මේ ගරු සභාවේ ගරුත්වය රැකදෙන ආකාරයට මෙතෙක් කාලයක් මා කටයුතු කලා සේම ඉදිරියටත් විපක්ෂ නායක හැටියට කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මම ගරු නගරාධිපතිතුමනි අපි සම්ප්‍රදායික විපක්ෂයක් හැටියට නොවෙයි මම ඔබතුමාට කියන්න කැමතියි අපි උත්සහ කරන්නේ හැම විටම අපි තේරිලා පත්වෙලා තියෙන්නේ මේ ජනතාවට සේවය කරන්න මොන පක්ෂයෙන් වුනත්. එදා යම් හෙයකින් ඔබතුමාගේ පක්ෂය පැරදුනා නම් අපේ කෙනෙක් ඔය ස්ථානයේ ඉන්නේ. අපි කරන්නෙත් ඔබතුමා කරන්න උත්සහ කරන හොඳ දේවල්ම තමයි. නමුත් එක දෙයක් කරනවා අපි පක්ෂයක් හැටියට විපක්ෂනායක හැටියට මගේ කටයුත්ත වෙන්නේ ඔබතුමා වැරදි මාර්ගයක යනවා නම් ඒක විවේචනය කරලා හරි මාර්ගයකට ගෙන එන්න. නමුත් අපේ පොදු අරමුණ දෙගොල්ලොගෙම හරි දේ කරලා මොරටුව ජනතාවට සේවය කිරිමට. ඒ කටයුත්ත මේ අලුත් තනතුරත් සමඟ අපේ මන්ත්‍රී කණ්ඩායමේ සහයෝගයත් එක්ක පක්ෂ මහ ලේකම්තුමාගේ මඟ පෙන්වීම තුල කිරිමට අපි බලාපොරොත්තු වෙනවා. ඒවාගේම මගේ මේ පත්විමේ ලිපිය ලැබිච්ච වෙලාවේ මම දින 3-4 කට කලින් ඔබතුමා හමුවෙලා ඒ ලිපිය ඉදිරිපත් කරපු වෙලාවේදි ඔබතුමා කිව්වා මම මුල් පුටුවේ වාඩිවිය යුතුයි කියලා මම ඒත් ඔබතුමාට කිව්වා මම සිටින ස්ථානය ප්‍රශ්ණයක් නැහැ කියලා. නමුත් ඔබතුමා මේ ගරු සභාවේ ගරුත්වය රැක ගන්න ඕන නිසාත් මෙහි තිබෙන සම්ප්‍රදායන් නිසාත් ඔබතුමා කිව්වා නැහැ මම ඔබතුමාට හිමි ඒ පුටුව ලබා දෙන්නම් කියලා මා ස්තුතිවන්ත වෙනවා මැක්සි මන්ත්‍රිතුමාටත්, සුනිල් නන්දසිරි මන්ත්‍රීතුමාටත් ඉල්ලිමකින් තොරව ඔබතුමාට ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කරලා මට මේ ස්ථානය ලබා දිම පිළිබදව. වාඩි වෙන තැන නොමෙයි නගරාධිපතිතුමනි ප්‍රශ්ණය තියෙන්නේ නමුත් ඒ සම්ප්‍රදායන්, සම්ප්‍රදායන් වලට මේ අය ගරු කිරිමත්, ඔබතුමා ඒක ඒ ආකාරයටම කටයුතු කිරිම ගැනත් මම විශේෂ ප්‍රශංශාවක් ඔබතුමාට මේ අවස්ථාවේදි පුද කරනවා. ඒවගේම මම ස්තුතිවන්ත වෙනවා මේ ගරු සභාවේදි අපේ ගරු සුජිත් පුෂ්පකුමාර ගරු මන්ත්‍රීතුමාත්, මන්ත්‍රීතුමා , අනිකුත් මන්ත්‍රීවරුත් මා සම්බන්ධව කලා වූ යහපත් කථාවන් ගැන ස්තුතිවන්ත වෙමින් අපේ සහයෝගය ඉදිරියටත් මේ ආකාරයටම ඔබතුමාට ලබා දිලා මොරටුව ජනතාව හොඳ තත්වයකට ගෙන ඒමට විපක්ෂයක් හැටියට අපිට කරන්න පුලුවන් හැම දෙයක්ම කරන බවට ප්‍රකාශ කරමින් මම නිහඩ වෙනවා.

## 03. සභාව අමතා ඒවන ලද ආයාචනා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

### 03(1) මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමනි, විශේෂ ස්තුතියක් පුද කරන්න ඕන මොරටුමුල්ලේ තිබුන කුණු කන්ද ඉවත් කරලා තියෙනවා. නමුත් මම ප්‍රශ්නයක් හැටියට යොමු කරන්නේ ඒ කුණු කන්ද ඉවත් කිරිමේදි ඔබතුමා දන්නවා කුණු කන්ද ඉවත් කිරිම සම්බන්ධයෙන් කවුද කථා කලේ කියලා. ඊට පසුව සභාවේදිත් මන්ත්‍රිවරයෙක් ඒ සම්බන්ධයෙන් කථා කළා පොහොට්ටුව පැත්තෙන්. මම ඔබතුමාට යෝජනා කළා නාගරික කොමසාරිස්තුමාට ඔබතුමා නැති කාලේ දිගින් දිගටම කරදර කළා මේ කුණු කන්ද ඉවත් කරන්න. නමුත්, ඔබතුමා කුණු වලට ආදරය කරන කෙනෙක් හැටියට මම කමෙක්ට් දාලා තියෙනවා ෆේස් බුක් එකේ. ඔබතුමා මේක ඉවත් කලා කියලා දැඩි විශ්වාසයක් මගේ තිබුනා. ඒ වගේම ඒක වුනා. නමුත් මාධ්‍ය පළ කරලා තියෙනවා අරුණ පුවත් පතේ ඒ පුවත නිවැරදි ආකාරයෙන් පල කරලා නැහැ. මෙතන සභාව නියෝජනය කරන මාධ්‍ය වේදියෙක් හැටියට ඔවුන්ගේ වගකීම නිසි ආකාරයෙන් ඉටු කිරිම ඔවුන්ගේ යුතුකම වෙනවා. මා දැඩි ලෙස එයට විරුද්ධ වෙනවා. ඒ මොකද මේ යෝජනාව මම ගෙනාවේ ඔබතුමා දන්නවා කොමසාරිස්තුමා දන්නවා. මට මගේ නම අවශ්‍ය නැහැ ඒක ඉවත් වීම ගැන ඇත්තටම සතුටුයි. ඊට පස්සේ සභාවේදි තිලකසිරි මන්ත්‍රිතුමාත් යෝජනා කලා. ඒවගේම මගේ සහෝදර මන්ත්‍රිතුමියත් යෝජනා කලේ වෙන ආකාරයක්. මම එතුමියටගේ අදහසට විරුද්ධ වෙන්නේ නැහැ. ඔබතුමා එක්ක ගස්ටනයකුත් ඇති වුනා. ගරු නගරාධිපතිතුමනි මෙතන මාධ්‍ය ක්‍රියා කරන ආකාරය ගැන ගැටලුවක් තියෙනවා. මේ මාධ්‍ය වේදින් අපි ප්‍රකාශ කරන තොරතුරු නිවැරදිව නිසි පරිදි මාධ්‍යයෙන් ඉදිරිපත් කල යුතුයි. ඒ ඉදිරිපත් නොකිරිම නිසා ජනතාව අපහසුතාවයට පත් වෙනවා අපි කියන දේ අපි ජනතාවට කථා කරනවා ජනතාව ප්‍රශ්ණ යොමු කරන නිසානේ අපි මේ යෝජනා කරන්නේ ඒ යෝජනා නිසි ආකාරයෙන් මාධ්‍ය ඉටු නොකරන නිසා මාධ්‍ය නිසි ආකාරයෙන් කටයුතු කිරිමට ඔබතුමාට මගේ මේ ප්‍රශ්ණය යොමු කරන්නේ අපි අවශ්‍ය දේවල් යෝජනාව කලාම මාධ්‍ය නිසි ආකාරයෙන් පල කරන්නේ නැහැ නම් කපනවා වෙන වෙන ආකාර තියෙනවා මම ඒවා කියන්න කැමති නැහැ. මාධ්‍ය පල වෙන හේතු. ඒ ගැන කථා නොකර ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා කුණු කන්ද ඉවත් කිරිම සම්බන්ධව. මම දන්නවා ඒක සමුපකාරයට අයිති කුණු කන්ද නමුත් ඒක කොහොම හරි මම නගරාධිපතිතුමාව ප්‍රසිද්ධියේ ෆේස්බුක්

හරහා විවේචනය කරලා තියෙනවා. කුනු වලට ලව් කරන නගරාධිපතිතුමෙක් කෙනෙක් කියලා. එතුමා කැමැත්තෙන්ම ඒක යූ ටියුබ් එකක තියෙනවා මම දැක්කා. මගේ අදහස මම ඉදිරිපත් කරනවා.

**03(2)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මට මතක් වෙනවා පොඩි කාලේ අහපු සිංදුවක්.

පුල්ලිගොනා ගෙට පැනලා කඹේ කඩාගෙන - ගෙදර උන්දා කොන්ඩෙ බඳින හවරිය කාලා කොණ්ඩෙ බඳින්නට විදියක් නැතැයි කියාලා - මටයි දෝෂ කියන්සේ මම මක් කරන්නද අපිට දෝෂ කියන්නේ අපි මක් කරන්නද - හත්වලාමේ වෙච්චදේට මක් කරන්නද හත් වලාමේ වෙච්ච දේට මක් කරන්නද

ගරු නගරාධිපතිතුමනි, මම මේ ප්‍රකාශය කරනකොට ඒ සිංදුවේ අර්ථය මේ සභාවට දැනේවි. මහා නගර සභා ආඥා පනත සහ අතුරු ව්‍යවස්ථාව සභා මන්ත්‍රීවරුන්ගේ විනය රෙගුලාසි විනය ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් යම් යම් ප්‍රකාශ යම් යම් මන්ත්‍රීවරු කරනවා. හැබැයි මේ නිකං පොතක් දිහා බලලා මේ පොතේ මෙන්න මෙහෙම තියෙනවා කියලා යම් යම් පිරිස් වලට චෝදනා කිරිම මම හිතන්නේ මන්ත්‍රීවරයෙක් විසින් නොකල යුතු ක්‍රියාවක් කියලයි මම හිතන්නේ. මහ නගර සභා ආඥා පනත උල්ලංඝනය කරනවා කියලා කියනවා නම් කවුරු හරි මන්ත්‍රීවරයෙක් අදාල මන්ත්‍රීවරයට පුලුවන් කම තියෙන්නට ඕනැ මහ නගර සභා ආඥා පනතේ අහවල් පිටුවේ අහවල් වගන්තිය මෙන්න මෙහෙම උල්ලංඝනය කරනවා කියලා කියන්න. ඒ වගේම තමයි දෙයක් කියවලා තේරුම් ගන්න බැරි ඔලුවක් නැති මිනිස්සු කියන යම් යම් ප්‍රකාශ නිසා මහා විශාල ප්‍රශ්ණ ඇති වෙනවා. මනෝජ් මන්ත්‍රීතුමා බොහොම වැදගත් මම ඉදිරිපත් කරන පැමිනිල්ලට ප්‍රවේශයක් ගෙනාවා. ගරු නගරාධිපතිතුමනි මම උසස් පෙළ හැදැරුවේ ද සොයිසා පුර මහ විද්‍යාලයේ මගේ සහෝදර මන්ත්‍රීතුමාත් එහා පැත්තේ ඉන්නවා. මම උසස් පෙල ඉවර වෙලා මම ගියා ජාතික තරුණ සේවා සභාවේ ජනමාධ්‍ය වේදි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරන්න. අපි ඉගෙන ගත්ත දෙයක් තියෙනවා ජන මාධ්‍ය කලාවේ. යම් කිසි කරුණක් දැකපු සැනින් අහපු සැනින් එය මාධ්‍යයේ පළ කරන්න හොඳ නැහැ. හේතුව ඒ තුළ මාධ්‍යයේ පල කරන යම්කිසි දෙයක් නිසා තවත් පාර්ශවයකට අගතියක් වෙන්නට බැහැ. තවත් පාර්ශවයකට අගතියක් වෙන දේවල් පල

කරන්න හොඳ නැහැ. එහෙම නැත්නම් ඒ පාර්ශවයන් දෙකෙන්ම කරුණු විමසලා ඒ පාර්ශවයන් දෙකේම අදහස් විමසලා ඒ අදාල කරුණ පිළිබඳව පළ කිරිම තමයි මාධ්‍ය සදාචාරය කියලා කියන්නේ. හැබැයි ගරු නගරාධිපතිතුමනි අපිට පොඩි ප්‍රශ්නයක් තියෙනවා අද වෙනකොට සමහර මාධ්‍යවේදියෝ ක්‍රියා ත්මක වෙන්නේ මාධ්‍ය සදාචාරය කුණු බාල්දියට දාලා තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා ඉටු කර ගැනිම සඳහා යම් යම් ඩීල් දාගෙන ඒ ඩීල් ඔස්සේ තමයි මාධ්‍ය පල කරන්න යම් යම් දේවල් ක්‍රියාත්මක වෙන්නේ කියන එක තමයි අපේ අදහස. ඒකේ එකක් තමයි මනෝජ් මන්ත්‍රිතුමාට වුනේ. ඒ විතරක් නොවෙයි මාධ්‍ය වල පලවෙන සමහර වාර්තා දකින කොට මේ සභාව පිලිබඳව මේ සභාවට එන මාධ්‍ය වේදියන්ට ඇහෙන්නේ එක පිරිසක් කථා කරන දේ විතරද කියලා. ඒ පිරිස කථා කරන දේ විතරයි ඇහෙන්නේ. අනිත් පිරිස කියන දේ ඇහෙන්නේ නැහැ. සමහර වෙලාවට අපෙන් කෝල් කරලා අහනවා මොකක්ද කිව්වේ කියලා. ඒ නිසා අපිට ප්‍රශ්ණයක් තියෙනවා අපිට වගකීමක් තියෙනවා ලක්ෂ දෙකක ජනතාවක් නියෝජනය කරන්නයි මේ 48 දෙනා ඉන්නේ. මේ 48 දෙනා ඉන්නේ ඒ ඒ පක්ෂයන් වල අදහස් යෝජනා ක්‍රියාත්මක කරන්න. ඒ ජනතාවගේ යෝජනා නගර සභාව හරහා ක්‍රියාත්මක කරවා ගන්න තමයි මේ මහ සභාව තියෙන්නේ.මේ මහා සභාවට ඇවිල්ලා ජනතා නියෝජියෝ හැටියට ඒ කරන කාර්ය භාරය විකෘත්ති කරලා මාධ්‍ය යනවා නම් ඒ මහජන නියෝජිතයාගේ පෞද්ගලිකත්වයට හානි වන පරිදි මාධ්‍ය ක්‍රියාත්මක කරන්නේ ඒ පැන ක්‍රියාත්මක කරන්න යම් යම් උදවිය උත්සහ කරනවා නම් ඒක නොවෙයි මාධ්‍ය සදාචාරය. මාධ්‍යයෙන් හොඳටම බැට කාපු මිනිහෙක් තමයි මම. මම හිතන්නේ නැහැ මේ නගර සභාවේ මම තරම් මේ මාධ්‍ය නිසා විනාශ වෙච්ච දුක් විඳපු වෙන කෙනෙක් ඉන්නවා කියලා. ඒ නිසා බොහොම ගෞරවයෙන් මට වෙච්ච දේ අනිකුත් මන්ත්‍රිවරුන්ට නොවේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මාධ්‍ය නිසා අපිට වෙච්ච හානිය අපි මේ මාධ්‍යවේදින්ගෙන් බොහෙම ගෞරවයෙන් ඉල්ලනවා මේ අහිංසක මහජන නියෝජිතයින් කැප කිරිම් කරලා මෙතනට එන්නේ මේ මහජන නියෝජිතයින්ගේ ආත්මය විනාශ කරන්නට එපා. දේශපාලනය විනාශ කරන්න ට උත්සහ කරන්න එපා කියන ගෞරවනීය ඉල්ලිම කරනවා. හැබැයි මේක මේ කරන්නේ මෙතනින්. මේ කරන ප්‍රකාශත් විකෘත්ති කරන්න උත්සහ කරනවා නම් එතනින් එහාට ගිහිල්ලා කටයුතු කරන්න පුලුවන් හැකියාව අප සතුව තියෙනවා කියන එකත් අපි පැහැදිලිව කියන්නට ඕන.

මම ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා මෙන්න මෙහෙම මීට පස්සේ මේ මාධ්‍ය හරහා යම් කිසි අකටයුත්තක් මන්ත්‍රිවරයෙකුට වුනා කියලා මෙතන

චෝදනාවක් ආවොත් කරුණාකාරලා මාධ්‍ය ආයතන ප්‍රධානින්ට ඒ පිළිබඳව ලිඛිතව දැනුවත් කරන්න. ඒක අපිට සදාචාරාත්මක අයිතියක් තියෙනවා පුවත්පත් මණ්ඩලයක ඒ චෝදනා ඉදිරිපත් කරන තැන් තියෙනවා. ඒ නිසා මේ මාධ්‍යවේදින්ට ඕන ඕන විදියට තමන්ට ඕන දේ ප්‍රකාශ කරන්න බැහැ. හරි දේ ප්‍රකාශ කරන්නට ඕන. කාටවත් අගතියක් නොවෙන්න ප්‍රකාශ වෙන්නට ඕන. ඒ නිසා කරුණාකරලා මෙතන හරි දේ හරි විදියට ප්‍රකාශ කරන්නේ නැත්නම් උදාහරණයක් තමයි මම දැක්කා ලංකා දීප පුවත්පතේ දිලා තියෙනවා ගිය සභාවේ වෙච්ච සිදුවීමක්. සභාවක ක්‍රමවේදය දන්නේ නැත්නම් ලියන්නේ නැතිව ඉන්න ඕන. මයික් එක ඔෆ් කරලා සභාවේ ක්‍රමවේදය අනුව පුටුවේ වාඩිවෙලා කරන ප්‍රකාශයක් මාධ්‍යයේ පළ වෙන්න බැහැ. ඒක සභාවේ ප්‍රකාශයක් නොවෙයි. පෞද්ගලික ප්‍රකාශයක්. එදා ජනතා විමුක්ති පෙරමුණේ නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීවරයා ආයතන කමිටු මන්ත්‍රීවරයාට කරපු ලොකු චෝදනාවක් කථා කරගෙන යනකොට යම්කිසි මත ගැටුමක් වෙලා බහින් බස් වීමක් වෙලා මයික් ඔෆ් කරලා මෙතන වාඩි වෙලා යම්කිසි ප්‍රකාශයක් කලා ඒ ප්‍රකාශය ලියලා නැහැ. හැබැයි තමන්ට ඕන දේ ලියලා. ඒ පැත්තෙන් ආවා ප්‍රකාශයක් මෙහෙට චන්ඩිපාට් දාන්න තියා ගන්න එපා කියලා. ඒක කලෙත් වාඩිවෙලා මම අහන්නේ ඒක ලියවෙන්නේ කොහොමද මාධ්‍යයෙන්. මොන සදාචාරාත්මක මොන අයිතමය යටතේද ඒක ලියවෙන්නේ. සුදේශ ඉන්ද්‍රජිත් මන්ත්‍රීවරයා වාඩි වෙලා කරපු ප්‍රකාශය ලියවෙන්න බැහැ මාධ්‍යයේ. මොකද හේතුව ඒක වාඩිවෙලා කරන්නේ. එකෙන් කාටද අගතිය වෙන්නේ. අගතිය වෙන්නේ අපිට. ඒකනිසා ගරු නගරාධිපතිතුමනි මාධ්‍ය හරහා ලියනකොට මේ අගතිදායක තත්ත්වයන්ගෙන් මේ මහජන නියෝජිතයින්ව ආරක්ෂා කර ගැනිම ඔබතුමාගේ වගකිමක්. ඒ නිසා මේ අගතිදායක තත්ත්වයන්ගෙන් මහජන නියෝජිතයින්ව ආරක්ෂා කර ගැනිම අපේ නායකයා හැටියට ඔබතුමාගේ වගකීමක්.

ලංකාදීප පුවත්පතේ එකම වාර්තාකාරිනියක් තමයි මේක ලියන්නේ මේ ලස්සන සුන්දර ලිපියක් මම දැක්කා මාධ්‍ය සාකච්ඡාවක් කියලා තමයි ගරු නගරාධිපතිතුමනි ලියලා තියෙන්නේ. මේක කියවනකොට ගරු නගරාධිපතිතුමනි මට නිකං සිනහ පහල වුනා. මේකේ තියෙනවා ලස්සන කතන්දර ටිකක් මොරටුව මහා නගර සභාවෙන් බෙදූ ආහාරවල් ලිඛිත සඳහනක් කර නැත. විගණනයෙන් හෙලිවෙලා ජ.වී.පී. මන්ත්‍රී නිශාන්ත ප්‍රදිනාන්දු කියයි. හත්වලාමේ වෙච්ච දේට මක් කරන්නද කියලා තමයි අහන්න තියෙන්නේ. මොකද හේතුව විගණන වාර්තාවක් සාමාන්‍යයෙන් ගරු නගරාධිපතිතුමනි ඔබතුමාගේ වරද මේක මම දකින්නේ. මේ මන්ත්‍රීවරුන්ට

විගණන වාර්තාව කියන්නේ මොකක්ද කියන එක පිලිබඳව අවබෝධයක් දෙන්න ඕන. කිසි අවබෝධයක් නැතිව මේකේ තියෙන කරුණක් දෙකක් අල්ලගෙන මාධ්‍ය සාකච්ඡාවක කියන එකක වාඩි වෙලා ඔහේ කටට එන දෙය ප්‍රකාශ කරන්න අර ගොනා හවරිය කැවා වගේ ප්‍රකාශ කරලා අන්තිමේ වෙන වෙන කට්ටියට දොස් කිව්වට අපිට කරන්න දෙයක් නැහැ. ගරු නගරාධිපති තුමනි. මොරටුව මහ නගර සභාවේ රුපියල් මිලියන 194 ක් පිලිබඳව සිදුකරන ලද විගණනයට අවශ්‍ය වෙන්නාවූ ලිඛිත සාක්ෂි නොමැති විම. තොරතුරු ඉදිරිපත් කිරිම යන හේතු මත වැඩිදුර පරික්ෂා කිරිමට නොහැකි වී ඇතැයි විගණන ප්‍රකාශනයක සඳහන් බව නාගරික මන්ත්‍රී ප්‍රදිනාන්දු මහතා කියයි. මම අහන්නේ මොකක්ද මේකේ තේරුම. රුපියල් මිලියන 194 කට අදාළව ලිපි ලේඛණ නැහැයිලු. හරි නැහැ. දැන් කවුද ඒකට පලි. මේකේ අවසානයේ තියෙනවා . නගරාධිපතිවරයා කාලද ඒක. රුපියල් මිලියන 194 කට අදාල ලිපිලේඛන නැත්නම් ගවර්මන්ට් ඔඩිට් එක 194 ලිපිලේඛන නැහැයි කියලා සාරාංශගත කරුණක් අල්ලගෙන නැත්තේ මොකටද මොනවද මේ ගනුදෙනු සිදුවෙලා තියෙන ඒ කිසිම දෙයක අවබෝධයදක් නැතිව සොයා බැලිමක් නැතිව මෙතනින් දුවගෙන ගියා මේසයක් ගාව වාඩිවුනා තමන්ට හිතවත් මෙතන සතර කම්මන්ත්‍රණ, අට කම්මන්ත්‍රණ, 16 කම්මන්ත්‍රණ කරන මාධ්‍යවේදියෝ ටික ලං කර ගත්තා කිව්වා මෙන්න මෙහෙම එකක් තියෙනවා දාමු කියලා දැම්මා මේක දැම්මම හරිනම් මාධ්‍ය සදාචාරය තමයි මේක අහන්න ඕන නගරාධිපතිවරයාට කථා කරලා නාගරික ගණකාධිකාරි වරයට කථා කරන්න ඕනෑ. කොමසාරිස් වරයට කථා කරන්න ඕන. ඒක තමයි මේකේ සත්‍ය තත්ත්වය. ගරු නගරාධිපති තුමනි මෙතන පොඩි ප්‍රශ්ණයක් තියෙනවා. ආහාර මලු 9000 ක් බෙදා දි ඇති බව සඳහන් කරන එම මන්ත්‍රිවරයා ආහාර මලු බෙදා දුන්නේ කාටදැයි කෙසේ දැයි ලිඛිත සඳහක් කර නොමැති බව පැවසිය. නැවත කියනවා මේවා බෙදා දුන්නට අපට කමක් නැහැ. අපි තරහා නැහැ මේවා බෙදාදුන්නට. හැබැයි මේවා බෙදා දුන්නේ කාගේ නම් වලටද කියන එක අපිට සඳහනක් නැහැ.අපිට දිලා නැහැ. ඒ කියන්නේ ඉල්ලන්නේ මලු 9000 දුන්න මොරටුවේ ඉන්න පවුල් 9000 නම් තමයි ඉල්ලන්නේ. සෝමපාල, සිරි අක්කා,එන්සිනා එහෙම නම් තමයි ඉල්ලන්නේ.මේ නම් ටික අරගෙන මොකක්ද කරන්නේ. මේක සම්බන්ධයෙන් අපිටත් ගැටලු තිබුනා. හේතුව අපි ශ්‍රි ලංකා නිදහස් පක්ෂය හැටියට මේවා බෙදනවා අපි බලන් හිටියා. අපිටත් පොඩි වේදනාවක් ආවා මේක බෙදනකොට අපිට දුන්නේ නැහැ. නගරාධිපතිවරයා පෞද්ගලිකව ටිකක් දුන්නා එච්චරයි. හැබැයි ඊට වඩා මේ දුන්නු එක අවස්ථාවේ මහා ලොකු පුන්‍ය කර්මයක්. මිනිස්සු නන්නත්තාර වෙලා හිටියේ ඒ වෙලාවේ. ඒ වගේම තමයි නගරාධිපතිතුමනි

මේක තියෙනවා මහ නගර සභා ආඥා පනතේ ආඥා පනතට අනුව නොවෙයි මේක කරලා තියෙන්නේ කියලා. මෙයා කියනවා නගරාධිපතිවරයා අත්තනෝමතිකව තම හිතුමතයට අනුව කටයුතු කර ඇති බව පෙනී යන බව සඳහන් කරයි. නගරාධිපතිවරයාගේ අත්තනෝමතික බව මොකක්ද? බඩු මලු බෙදපු එකද. බඩු මලු බෙදන්න ගියේ නගරාධිපතිවරයා ද අපට උත්තර දෙන්න ගරු නගරාධිපතිතුමනි මොකක්ද මේකේ අත්තනෝමතික ක්‍රියා කලාපය කියලා. ඒවගේම මේකේ තව සඳහනක් තියෙනවා ගරු නගරාධිපතිතුමනි මේවා දානකොට මට නැවත මාධ්‍යට තමයි කියන්න තියෙන්නේ. මාධ්‍ය සදාචාරය පිලිබඳව තව ප්‍රශ්ණයක් එනවා මේකේ කියනවා මේ වෙනවිට විල්ලෝරාවත්ත ඔහුගේ නිවසට හැරෙන ප්‍රධාන මාර්ගය අසල සිය බලය යොදා තුන් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරිමට ක්‍රියාත්මක බව සඳහන් කරන මන්ත්‍රිවරයා මෙම ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා මොරටුව මහ නගර සභා කම්කරුවන් යොදා ගෙන ඇති බව සඳහන් කෙරේ. ගරු නගරාධිපතිතුමනි මේක අපට තියෙන ගැටලුව කවුරු හරි මෙතන කටට එන දේ එහෙම නැත්නම් තව කවුරු හරි කියන දේ ඔහේ ප්‍රකාශ කරන්නන් වාලේ ප්‍රකාශ කරනවා. මාසේ මහ සභාව දවසට තමයි ඇවිල්ලා මෙතන තියෙන කුණු ටික අදින්නේ. එහෙම නැත්නම් මහ සභාවෙන් ඉස්සෙල්ලා ඇවිල්ලා කරන්නේ හොඳ දේවල් නොවෙයි. යහපත් දේවල් නොවෙයි. මෙතන ඇවිල්ලා කරන්නේ කොහෙද කුණු තියෙන්නේ කොහෙද වැරදිලා තියෙන්නේ යහපත් දේවල් වලට අත උස්සන්නේ නැහැ.උදවු කරන්නේ නැහැ. ඒක නිසා ගරු නගරාධිපතිතුමනි මේක මම දකින්නේ සමන්ලාල් ප්‍රනාන්දුට ගහපු දෙයක් නොවෙයි. සමස්ථය හැටියට නගරාධිපතිවරයා හැටියට මේකට පැහැදිලි උත්තරයක් දෙන්නට ඕන මේ නිවස හැදිම සම්බන්ධයෙන්. මොකද හේතුව මේකේ ප්‍රබල මේකට නිත්‍යානුකූල පියවර ගන්න ඕන කියන තැන තමයි අපි ඉන්නේ. හේතුව මේකේ කියනවා කම්කරුවෝ යොදවලා වැඩ ගන්නවා කියලා. අනිත් එක තමයි ඔබතුමා ගෙයක් දහනවා කියලා අපි දන්නේ නැහැ. මේ වෙන විට මොරටුව නගර සභාවේ ආදායම් මේක තමයි ලස්සනම වැඩේ. ගරු නගරාධිපතිතුමනි ඔබතුමාත් එක්ක මම අහගෙන එක වෙලාවකට රන්ඩු කරනවා අරෙහෙන් නිදහස් කරන්න මෙහෙන් නිදහස් කරන්න අර ආදායම් අර ගාස්තුව නිදහස් කරන්න මේ ගාස්තුව නිදහස් කරන්න කියලා. හත්වලාමේ මාධ්‍යට ගිහිල්ලා කියනවා මේ වෙනවිට මොරටුව මහ නගර සභාවේ අදායම් එකතු කර ගැනිමට නගරාධිපති සහ මන්ත්‍රිවරු අසමත් වි ඇති බව සඳහන් කරන ඒ මහතා සභාවට ආදායම් නොලැබෙන තත්ත්වයක් වී ඇති බව සඳහන් කරමි. මේක මොකක්ද තේරුම. ඒ කියන්නේ මොරටුවේ ඉන්න මහජනතාවගේ බෙල්ල මිරිකලා බොටුවෙන්

මීරිකලා මේ කොරෝනා කාලේ අන්ත අසරණ වෙලා ඉන්න මිනිස්සුන්ගේ බෙල්ල මිරිකලා රිරි මාංස ටික උරාගෙන බිපල්ලා. මේ සල්ලි ටික මේකට ගෙනල්ල කියලද කියන්නේ. මොනවා හරි නීති රිති දාලා ගෙනාවනම් මොනවද කියන්නේ. ඒ නිසා අපිට තියෙන ගැටලුව ජනතා විමුක්ති පෙරමුණ නැගිටින්නේ මොන පැත්තෙන්ද කන්නේ මොන පැත්තෙන්ද කියලා ප්‍රශ්ණයක් තියෙනවා අපිට. ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම් නායක මේ කියන්නේ. ලැජ්ජයි. නින්දා සහගත ප්‍රකාශයන් මේවා.

ගරු නගරාධිපතිතුමනි තව එකක් තියෙනවා. මම ආයතන කමිටු සභාපති වරයා. අපි මේ අවුරුද්ද තුල කිසිදු සේවකයෙකුගේ අතිකාල දීමනා කප්පාදු කරලා නැහැ මම දන්නා විදියට. ඔබතුමා එහෙම කරලා නැහැනේ. එහෙම කරලා නැහැ. එතකොට මේකේ තියෙනවා මේ වෙනවිට මොරටුව මහ නගර සභා සේවකයන්ගේ අතිකාල වැටුප් සහ සුභසාධන මුදල් යෙදවිමට අපොහොසත් වි ඇති නගරාධිපතිවරයා හත් වලාමේ මේක නගරාධිපතිවරයා කරලා තියෙන්නේ. නගරාධිපතිවරයා පවතින ගොඩනැගිල්ලට සෝපානයක් සකස් කිරිම සඳහා ලක්ෂ 20 ක් වෙන් කර ඇති බවද පැවසිය. ලක්ෂ 3 න් සෝපාන හදන්න පුලුවන්ද. පැහැදිලි ඉරිසියාව එහෙම එකක් තියෙනවා.මට මෙහෙම ප්‍රශ්ණයකුත් තියෙනවා ගිණුම් වාර්තාවෙත් තිබුනා අධිහාර සම්බන්ධයෙන් මන්ත්‍රිවරුන්ටත් අධිහාර තියෙනවද ඒ නම් ටික අපිට කියන්න. අධිහාර නිර්මාණය වුනේ කොහොමද කියලා අපිට කියන්න. අධිහාර නිර්මානය වෙන්න සල්ලි ගත්තේ කවුද කියලා අපිට කියන්න. ගත්තේ මොන හේතුවටද කියලා කියන්න. ඒ නිසා මේ මාධ්‍ය සම්බන්ධයෙන් අපට ගැටලු තියෙනවා. ඒ නිසා මාධ්‍යවේදින්ගෙන් ගෞරවයෙන් ඉල්ලනවා මාධ්‍යයේ යම් දෙයක් පල කරන කොට මේ අහිංසක මන්ත්‍රිවරුන්ගේ ආත්මය විනාශ කරන්න මාධ්‍ය පල කරන්න එපා තමන්ගේ පෞද්ගලික මති මතාන්ත්‍ර පෞද්ගලික දේවල් මාධ්‍ය තුළ පළ කරන්න එපා කියන ගෞරවනිය ඉල්ලිම කරනවා ඒ වගේම අපි ජනතා විමුක්ති පෙරමුණ ගැන අපේ සංවේගය මේ අවස්ථාවේ පළ කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, මේ පළ වුණ ප්‍රකාශය සම්බන්ධයෙන් කරුණු කිපයක් හා මගේ නම ඇතුළත්වීම වුණු කරුණු කිපයක් එතුමා ප්‍රකාශ කරලා තියෙනවා. ඒ කරුණු වල පළවෙනි ඒක බඩු මලු සම්බන්ධයෙන් කථා කලා ඒ සම්බන්ධයෙන් විගණන වාර්තාවේ තිබුණා. අපි ඒකට උත්තර ලිව්වා. ඒ එක්කම කියනවා මිලියන 194 ක ලිපිගොනු අස්ථාන ගත වෙලා කියලා අපි ඒ ගැනත් සාකච්ජා කලා. ප්‍රශ්නය

තියෙන්නේ වීදුරු ගෙවල්වල ඉදලා ගල්ගහන්නත් උඩ බලාගෙන කෙල ගහන්නත් හොඳ නැහැ කියලා කථාවක් තියෙනවා. මේ ආහාර මලු අපි ලබා දුන්නේ කාටද කියන එක ඇත්තටම කවුරුත් දන්නවා මේ එක ගරු මන්ත්‍රිවරයෙක්වත් එකම ආහාර මල්ලක්වත් ගෙදර නොගිනිච්චා කියන එක විවාදයක් නැහැ. ප්‍රතිපක්ෂ මන්ත්‍රිවරු පවා පිළිගන්න කාරණයක්. නමුත් මේ ආහාර මලු විතරක් නොවෙයි ජනතා විමුක්ති පෙරමුණට පවා දුන්නා පොත්පත් සහා මුදලින් ලබා දුන්න. පොත් පත් ලබා දිලා තියෙන්නේ කාටද කියලා ලේඛණයක් කවුරුවත් මට දිලා නැහැ. මම ඇහුවෙත් නැහැ. දැන් මගෙන් කවුරු හරි ඇහැවුවොත් ඒක දිලා තියෙන්නේ මොන බලපෑම මතද නගරාධිපතිවරයාගේ අත්තනෝමතික ක්‍රියා කලාපය වගේම සුදේශ මන්ත්‍රිවරයට මම දෙනවා පොත් කට්ටල කීපයක් ගරු මන්ත්‍රිතුමියටත් දුන්නා, රංග මන්ත්‍රිතුමාටත් දුන්නා. කණ්ඩායම් නායක තුමාටත් දුන්නා. පොදුවේ විපක්ෂයේ සියලුම දෙනාට දුන්නා. දැන් කාටද දුන්නේ. ඕක තමයි විගණනය. මේක විගණනය වෙන්නේ නැද්ද.විගණනය වෙන්න ඕන නැද්ද. බඩු බෙදුවෙන් නගර සභාවෙන්. පොත් බෙදුවෙන් නගර සභා සල්ලි වලින් මගේ පුද්ගලික සල්ලි වලින් නොවෙයි නේ. එතකොට කෝ ඒවායේ නම්.සමන්ලාල් නොවෙයි නේ බෙදුවේ. ඒ ඒ මන්ත්‍රිවරයා ගිහිල්ලා බෙදුවා. කෝ නම්.

**<u>මහා නගර සභා මන්ත්‍රි - ජී.එම්. නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපිට විපක්ෂයේ කිසි මන්ත්‍රිවරයෙකුට ඒ බඩු ලැබුනේ නැහැ.

**<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, මේ බඩුමුට්ටු ගැන නොවෙයි කථා කරන්නේ. මේ සියලුම මන්ත්‍රීවරු දන්නවා මොකක්ද මේ මම කියන්නේ කියලා. ඒක පස්සේ කථා කර ගන්න ඕන නම්.ගරු මන්ත්‍රීවරුනි මේ වෙලා තියෙන්නේ කන්න ඕන වුණාම කබරගොයා තලගොයා කර ගන්න යන්න එපා. ඇත්තටම කියනවා නම් විගණනය පිළිබඳව ඔය තරම් ලොකු ඇල්මක් බැල්මක් විගණනය හරි කියලා කියනවා නම් විගණන විමසුම් වලදි අධිභාරයට ලක් වෙලා තියෙනවා මම ඇතුලු එවකට හිටපු ශාන්ත ප්‍රදිනාන්දු, ජනතා විමුක්ති පෙරමුණ නොවන සුරේෂ් ඉන්දික, රවිනාත් ගුණසේකර,සුනිල් නන්දසිරි, මැක්සි පෙරාඩ්, සුරංග අපොන්සු ඇතුළුවන්නාවූ ගරු මන්ත්‍රීවරුන් අධිභාරයට ලක් වෙලා තියෙනවා. අධිභාරයකට ලක් වෙන්න තරම් විගණන විමසුම් වලට ගිහිල්ලා විගණනයේ තියෙන කරුණු මාධ්‍යට කියනකොට ඊට වඩා හොඳයිනේ අධිභාරයට ලක් වෙලා තියෙන මුදල ගෙවලා මම එකහයි විගණනයට කියලා නිශාන්ත

ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා ගෙවලා තිබියානම් ඉවරයිනේ. අපි ඒක නැහැ වරදියි අපි ෆයිට් කරනවා එතුමාගේ එකත් අයින් කරගෙන අපේ ඒවත් අයින් කරගන්න. අපේ ඒවා අයින් කරගෙන එතුමාගේ එක තියන්නත් බැහැ. එතුමාගේ එක අයින් කරගෙන් අපේ ඒවා තියාගන්නත් බැහැ. අපි උත්සහ කරන්නේ ඒ අධිහාරයේදී නිලධාරින්ට අධිහාරය අයින් කලා නම් මන්ත්‍රීවරුනුත් අයින් වෙන්න ඕන කියන තැන අපි ඉන්නේ. ඒ විගණනයට ලක්වෙලා අධිහාරයට ලක්වුන අර මිලියන 194 ක මුදලක්මෙහි තියෙනවා.

නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා ම මේ සභාවේ කියලා මුදල් කමිටුවට කියලා කඩ කාමර කුලි අයින් කරමු. මේ මාසේ අයින් කරමු. අඩක් අයින් කරමු. ඒ මුදලුත් මේක ඇතුලේ තියෙනවා. අධිහාරයේ මුදලුත් මේක ඇතුලේ තියෙනවා. මේ සම්පූර්ණ දේවල් මේක ඇතුලේ තියෙනවා. මේ තියෙන ඒවායේ එතනට ගිහිල්ලා කියනවා තමුනුත් ගෙවන්න තියෙනවා.ඒ කියන්නේ විගණනය හරි. විගණනය හරිනම් එතුමා වැරදියි. මගේ ඉඩමක ගෙයක් හදන්නේ නැහැ. බිල්ඩින් එකක් හදනවා මගේ ඉඩමේ නොවෙයි. මට ජාතක වෙච්ච දරුවෙක් ගෙයක් හදනවා නම් මම කැලැවේ ඉදලා නැහැ. අයිඩින්ඩ් හොරකම් කරලා නැහැ. කැට හොල්ලගෙන නැහැ. මම මේ ව්‍යාපාරය කරලා තියෙන්නේ පුංචි කාලේ ඉස්කෝලේ යනකාලේ ඉදලා මම මේ ව්‍යාපාර කරන්නේ ප්‍රනාන්දු ලී බඩු නිශ්පාදනය හා බෙදා හැරිම කියලා ලියාපදිංචි කරලා තියෙන්නේ අද ඊයේ නොවෙයි. දැනටත් මම බයත් නැහැ ණයත් නැහැ මේවා මොනවද මේ නගර සභාවේ අනුමත කරලා ප්ලෑන් එක තියෙනවා. එකේ කිසි ප්‍රශ්ණයක් නැහැ. හැබැයි මේ නගර සභාවේ අනුමත කරන්නේ නැහැ කියලා වෙන වෙන තැන් වලට ගිහිල්ලා අනුමත කරගෙන ලක්ෂ 5000 කට ගෙවල් විකුනනවා කියලා ඇඩ්වටීස්ම නුත් දාලා තියෙනවා. මේවා ගැන කථා කරන්නේ නැහැ කවුරුත්. පොදු කටයුතු කරන්න තිබුන ඉඩම් අල්ලගෙනම වැඩේ කරලා මේවා ගැන කටයුතු කරන්නේ නැහැ. කථා කරන්නේ නැහැ. කන්න ඕන වුනාම කබරගොයා තලගොයා කර ගන්න යන්න එපා. මම කිසි බයක් නැහැ මම කරන එක වැඩකටවත් මම කාටවත් ඒ වෙනුවෙන් පෙනි සිටින්නෙත් මොකද මේ සභාවේ වැඩ කරලා ඕන තරම් අල්ලස් දූෂන වලට පහුගිය කාල සීමාවන් වලදි ලිපිගොනු ගිහිල්ලා දිලා ඒකටත් සාක්ෂි දී ගන්න බැරුව මට ලිපියක් එව්වා ඒක විභාග කරන්නේ නැත සාක්ෂි වලට කවුරුත් පැමිණෙන්නේ නැත කියලා. හිටපු විපක්ෂ නායක තුමා මුල් කරගෙන දාපු අල්ලස් දූෂණ පැමිණිලි එකට දාපු එකක්. තව ගොඩක් දේවල් තියෙනවා ක්‍රමක් ක්‍රමයෙන් එනවා. නීතිය ඒ පැත්තට මේ පැත්තට නවපු අවස්ථාවකදි පොදු කටයුත්තක් කරන් තිබුන ඉඩම යම් විදියකට ඒවා අපිට

ප්‍රශ්ණ නොවෙයි. මොකද අපි ඉපදෙනකොටම ගෙවල් ඇතුලේ ඉපදිච්ච මිනිස්සු ඔප්පුක් එක්ක අතට ආවේ ඉපදෙනකොටම ඔප්පුව ලියුවේ නැති වුනාට ඒ ඔප්පුව අයිති වුනේ මට. මට මේ කැලෑ වල ඉන්නවත් අනුන්ගේ දේවල් කඩා ගන්න වත් මට උවමනාවක් තිබුනෙ නැහැ පොඩි කාලේ ඉදලම. හැබැයි මම හිඟන්නෙක් විදියට ජීවත් වෙන්නේ නැහැ. මට හෙට තව ඉඩමක් ගන්න පුලුවන්කම තිබෙනවා. මොකද මගේ දරුවෝ ඔක්කොම රැකියාවල් කරනවා. ඒක හින්දා මට ප්‍රශ්ණයක් නැහැ. මගේ දරුවගේ නමින් තියෙනවා ඔහු හදනවා. කවුරු හරි කියනවා නම් නීතිරීතියට අනුව සොයිසා පාරේ සිට කඩාගෙන එනවා නම් සොයිසා පාරේ මට එහා පැත්තේ එක කඩනවා නම් මම කඩනවා. මට එහෙම ගැටලුවක් නැහැ. පුතා හදලා තියෙන්නේ පුතාගේ ඉඩම. අනුන්ගෙන් අල්ලාගෙනත් නැහැ. රජයේ ඉඩම් වලට ගිහිල්ලත් නැහැ. ගෙවල්වල කුලියට ගිහිල්ලා බලෙන් යන්නේ නැතුව ඉන්නෙත් නැහැ අපි අත් විදලා නැහැ. ඒක නිසා මාධ්‍ය කථා කරනකොට මේක ලියපු මාධ්‍යවේදිනිය මෙතනින් ගියා. ඒ නිසා මම හිතනවා මේවා කරනකොට ජනතා විමුක්ති පෙරමුණ මේවා පෙන්වන්න ඕන.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අධිභාර සම්බන්ධව ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, මේ අධිභාරය අද ඊයේ එකක් නොවෙයි.2002 සිට හිටපු ගරු මන්ත්‍රීවරුන්ට ඇති වුන අධිභාරයක්. ඒ අධිභාරයෙන් නිලධාරින්ව අයින් කරලා තියෙන නිසා අපි විගණනයෙන් අයින් කර ගත්ත ඒවා ගොඩක් තියෙනවා. මේක අහලා විගණනයත් එක්ක අපි කථා කරපු දේවල් එක්ක උරණ වෙලා එළියට ගිහිල්ලා මේක කථා කලාට අපිට කරන්න දෙයක් නැහැ.නමුත් ඔබතුමා කියපු එක හරි. මේවායේ තියෙන දේවල් ලියන්නට ඕනැ. අපි මේක අදාල වෙන්නාවූ ප්‍රධාන කතෘට දැනුම් දීම කරන්න ඕන මෙන්න මේ ආකාරයෙන්ම අපේ ඇහුවානම් අපි කියනවා ඔය විගණනය ඕක ඇතුලෙම තියෙනවා ජනතා විමුක්ති පෙරමුණ නායකයාටත් විගණනය වෙලා අධිභාරයට ලක්වෙලා තුන් ලක්ෂ ගානක් ගෙවන්න තියෙනවා ඒක ගැන කථා කරන්නේ නැහැ. එතුමා මේ මුදල් අය කර ගැනීම නගරාධිපතිවරයෙක් කරලා නැහැ කියලා කියනවා ඔච් එතුමාත් එකතු වෙලා සභාවේ විසින් අයින් කරපු මුදල් තියෙනවා. ඒවා ගැන කථා කරන්න මාධ්‍ය ඒක නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීවරයාගේ වරදක් නොවෙයි. ඒක මාධ්‍ය දැන ගන්න ඕන තවත් කෙනෙකුට එකේ අගතියක්

වුනානම් එකේ අගතිය හරිද වැරදිද ඒකට යම් කිසි වරදක් තියෙනවද කියලා මාධ්‍ය විමසන්න ඕන. එහෙම විමසීමක් කරන්නේ නැතිව පල කිරීම මම හිතනවා ඔබතුමා ඉගෙන ගත්තු ආචාර ධර්ම පද්ධතියත් එක්ක මාධ්‍ය කලාව තුල ඒවා මම හිතන්නේ සිදුවිය යුතු දේවල්. ඒ නිසා මම හිතනවා මේවා දිගින් දිගටම මේ පලවෙනි එක නොවෙයි, දෙවනි එක නොවයි, තුන්වෙනි එක නොවෙයි, කම්කරුවෝ වැඩ කරනවද, කම්කරුවෝ නැද්ද මම ඒක කියන්න යන්නේ නැහැ. කියන්න යනනේ නැත්තේ වෙන මොකක්වත් නිසා නොවෙයි ඒකට බය නිසා නොවෙයි එහෙම කියන්න ගත්තොත් මට ප්‍රශ්ණ ඇති වෙන්නේ නැහැ අපි දන්නවා මම රවිනාත් ජේ ගුණසේකර මැතිතුමා මොන විදියකින් වත් අමනාපයක් ඇති කර ගන්න එපා මම මේ කියන දේට මම මෙතනට එනකොටම සිකියුරිටි ඔක්කොම අයින් කරගෙන මෙතනට ආවේ. පරිත්‍යාග කියන ඒව කරලා තියෙනවා අනිත් පැත්තෙන් සභාවෙන් යම් යම් ගන්න ඕන දේවල් අරගෙන තියෙනවා. හැබැයි එතෙක් මෙතෙක් නගර සභාවකවත් නගරාධිපති විදියට මහ නගර සභාවකවත් එතෙක් මෙතෙක් සභාවට යම් දෙයක් ඉතිරි කරානම් සභාවට යම් දෙයක් ගෙනල්ලා තියෙනවා නම් ඒ ගෙනල්ලා තියෙන එකේ මම එක කියලා යන්න මම උත්සහ කරන්න යන්නේ නැහැ. හැබැයි මම දෙක නොවෙයි. මම මේ සභාවට ගෙනල්ලා තියෙන දේවල් රජයෙන් ගෙනල් තියෙන දේවල් විදේශ ආයතන වලින් ගෙනල්ල තියෙන දේවල් එක්ක දෙකක් නොවෙයි. ඒක නිසා කුහක කම ඊර්ශ්‍යාව වෛරය ක්‍රෝදය දේශපාලනයට පටලවා ගන්න එපා. ඇත්ත ඇත්තත් එක්ක ඉස්සරහට යන්න ඒවායේදි වරදින තැන් නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා කණට ගැහැවුවත් ඒ හරි දේකට නම් එතකොට පෙරලා ගහන්නේ නැහැ. මොකද නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමාලා ගහන තැන් වල ඉදලා තියෙන්නේ අපි විතරයි. කාර්යාල ගිනි තියලා ගහන තැන් වලදිත් ඉදිරිපත් වෙලා තියෙන්නේ පලවෙනි තැනට ගිහිල්ලා තියෙන්නේ ඒ චන්ඩි එහෙම ගහනකොට ඒචන්ඩිත් එක්ක යම්කිසි විදියකට මතගැටුමකට ලක්වෙලා ගිහිල්ලා තියෙන්නේ සමන්ලාල් ලා තමයි ඒවා නිශාන්ත ප්‍රදිනාන්දු දන්නවා. සුරේශ් ඉන්දිකත් දන්නවා. කොරළවැල්ල එක තැනකදි ඔබතුමා දන්නවා. කාර්යාලවලට ගහනකොට අපි ආවේ එවෙලේ.ඔබතුමාට මතක ඇති. ජයලත් පිරිස් මන්ත්‍රතුමාගේ කාර්යාලය අපි ගියා. ඒවා අපිට විවාද තිබුනේ නැහැ. හැබැයි ඉතිං මේවා තමන්ගේ ඇසේ පරාල තියාගෙන අනිත් අයගේ රොඩ්ඩ ගන්න ගියොත් ලොකු ගැටලු එනවා.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම හිතනවා විගණනයට අවනත නම් හෙට ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර කණ්ඩායම් නායක තුමා

අධිභාරයට ලක් වෙලා තියෙන ලක්ෂ 3 ගෙවල තව පාරක් මාධ්‍ය සාකච්ජාවක් තියලා අපි ශුද්දයි ගෙවලා ඉවරයි. එහෙම කරන්නේ නැතුව මේවා කියන්න යන්න එපා. හරිම අශෝබනයි මේවා වෙලා තියෙන්නේ මේ ඉන්නේ පොහොට්ටුවේ කෙනෙක් නිසා ඔහොම අපි හිතුවේ නැහැ අපි ඔතන ඉන්නකොට අපේ පුරුද්දක් තිබුනේ නැහැ එතන ඉන්නේ අපේ නගරාධිපති ඒ නගරාධිපති එක්ක මේක ඇතුලේ බේරගන්නවා ඇරෙන්න එලියට අපි යන්නේ නැහැ ඒවා චන්ද්‍ර ගාමිණී පිරිස් ගරු මන්ත්‍රීතුමන්ලා කවුරුත් සාක්ෂි දරනවා. අපි එහෙම කලා අපි මේ නගර සභාවේ ශත පහක් හරි වැඩිපුර යනවා නම්වැඩිපුර යන එක අපි නැවැත්තුවා. ඔය සම්පූර්ණයෙන්ම විගණනය සම්බන්ධයෙන් එදා සාකච්ජා කරලා අවසානයක් කරනකොට අවසානයට කලින් ගියා ඒ තමයි පලවෙනි වතාවට විගණනයක් සඳහා ඒකාබද්ධ කාරක සභාවක් තිබ්බ පලවෙනි වතාව මගේ 19 වෙනි අවුරුද්දේ. තියලා නැහැ කවදාවත්. මමත් අවුරුදු 4 ක් විපක්ෂයේ හිටියා. තියලා නැහැ. අපිට දුන්නේ නැහැ එහෙම අවස්ථා වෙන මුකුත් නොවෙයි මේන්න මේ කාරණය. ඒක නිසා කරුණාකරලා මේවා මාධ්‍ය වේදින් විදියට මේවා පල කිරිම. අද මාධ්‍ය වේදින්ට ස්ථානය මාරු කලා කියලා සභාවෙනුත් අහන්නේ නැතුව මාධ්‍ය වේදින් නැවත එම ස්ථානයට ගිහිල්ලා නැවත එතනට යන්න කිව්වයි කියලා මාධ්‍යවේදිනියක් ගියා. අද සභාවේ මම තීන්දුවක් ගන්න ඕනෑ මාධ්‍ය වේදිනිය සභාව හසුරුවනවද? සභාවට ඕන විදියට මාධ්‍යවේදින් හැසිරෙනවද සභාව තුල කියන එක තීරණයක් අරගෙන අද සභාවෙන් පිටව ගිය මාධ්‍යවේදිනියට නැවත සභාවට එන්න නොදීමට තීන්දුවක් ගන්න වෙනවා. එහෙම නැතුව බැහැ. සභාව ආවරණය කරන්නයි එන්නේ. ඒ ඇරෙන්න මේ කවුරුත් කලබල වෙන්න යන්න එපා මේ සභාව මෙහෙයවන්නේ නගරාධිපති මාධ්‍ය ආයතනය ගැන නොවෙයි මම මේ කිව්වේ.කලබල වෙන්න යන්න එපා. මම කිව්වේ මාධ්‍ය ආයතනයක් ගැන නොවෙයි. අද දිනයේදි සභාවට ඕන විදියට නොවෙයි එයාට ඕන විදියට සභාව මෙහෙයවන්න ගියා නම් මාධ්‍යවේදිනිය නැතුව ඕන විදියකට ලංකාදිප නැත්නම් දිවයින නැත්නම් අද පත්තරය නැත්නම් ඕන කෙනෙකු එවන්න ඕන සභාව පාලනය කරන්න නොවෙයි.මම මේ ආයතනය ගැන නොවෙයි කිව්වේ.මම බය නැහැ .හවාබවා ගාලා බොරුවට කියවන්න එපා උගත් මන්ත්‍රීතුමිය බය නම් මෙතන ඉන්නේ නැහැනේ තුන් පාරක් බය කියන එක දන්නෙත් නැහැ අපි. ජනතා විමුක්ති පෙරමුණ මරණ කාලෙත් බය තැන හිටියේ නැහැ අපි අයිඩින්ටි කාඩ් දුන්නෙත් නැහැ අපි.බය දන්නේ නැහැ අපි. නමුත් කරුණාකරලා මේ සභාව තමන්ගේ අතට ගන්න යන මාධ්‍යවේදින්ට මම ආයතනය ගැන කිව්වේ නැහැ ආයතනය මට ප්‍රශ්ණයක් නැහැ ආයතනයෙන් එවන්න පුලුවන්. හැබැයි මෙතන තමන්ට ඕන විදියට

මේක හසුරුවන්න යනවා නම් ඒ මාධ්‍ය ලියන කෙනා පිලිබඳව අපිට ප්‍රශ්ණයක් තියෙනවා. ආයතනයෙන් ඕන කෙනෙක්ව එවන්න පුලුවන්. අවුරුදු 16 කට පස්සේ මේ වගේ කථාවක් අහන්න වුනේ අද. කවදාවත් මම මෙහෙම කථා කරලො නැහැ.ඒ නිසා කරුණාකරලා සභාව පැත්තේ ඉදගන්න.මෙතන හෙට ඔබතුමිය ඉද ගත්තොත් ඔබතුමියටත් ඕක තමයි වෙන්නේ කරුණාකරලා එහෙම කරන්න යන්න එපා. ලියන එක ප්‍රශ්ණයක් නොවෙයි අපට තියෙන්නේ හැබැයි සදාචාරයක් තියෙනවා. එතුමත් එක්ක අහලා අපෙන් අහන්න තිබුනා මෙන්න මෙහෙම දෙයක් මොකක්ද මේ කියලා අහන්න තිබුනා. සජිත් මන්ත්‍රිතුමා එහෙම නොවෙයි ද. අහන්න තිබුනා එහෙම මුකුත් අහන්නේ නැතුව ලියාගෙන ලියාගෙන ගිහිල්ලා පත්තර වල පල වුනාම ඒවා ලොකු වරදක්.

(සභා ඝෝෂා)

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, ඔබතුමිය කරුණාකරලා ඉදගන්න.මගේ කථාව ඉවර නැහැ. ගරු මන්ත්‍රීවරුනි මම කථා කලේ වෙන මුකුත් නොවෙයි මේවා පලවෙලා පුවත්පත් වල අපිටත් ආත්ම ගෞරවයක් කියලා එකක් තියෙනවා. ගරු මන්ත්‍රිතුමිය ඕකද උගත් කම කියන්නේ. මට කථා කරන්න දෙන්න.

**<u>මහ නගර සභා මන්ත්‍රි - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ඔබතුමා ගේ කථාව අපි අහගෙන ඉන්නේ කැමැත්තෙන්. ඔබතුමා කියන කථා වලට අමතරව තවත් තවත් මන්ත්‍රිවරු කථා කියනවා.මන්ත්‍රිවරුන්ට ගෞරවය තියෙන් ඕන. ඔබතුමා කියන සමබරතාවයට අපි කැමතියි.

**<u>මහ නගර සභා මන්ත්‍රි - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, රීති ප්‍රශ්ණයක් තියෙනවා. සාමාන්‍යයෙන් සභාවාක මුලසුන කථා කරන වෙලාවට වෙන කෙනෙකුට කථා කරන්න බැහැ. ඒක තමයි සදාචාරය.නගරාධිපතිවරයා ප්‍රකාශයක් කරනකොට ඒ ප්‍රකාශයට අගේන්ස් වෙන කෙනෙකුට කථා කරන්න බැහැ රෙගුලාසි අනුව. ඒක තමයි ඇත්ත කථාව. අපිට ෆීල් බෑග් මොනාව හරි ප්‍රශ්ණ එනවා නම් අපි නීත්‍යානුකූලව මේ නගරාධිපතිවරයාගේ ප්‍රකාශයට සවන් දෙනවා නම් අපිට ගැටලුවක් නැහැ.සවන් දුන්නට පස්සේ නගරාධිපතිවරයාගේ ප්‍රකාශයේ යම් වැරද්දක් තියෙනවා නම් එතුමාගේ අවසරය පරිදි අපිට පෙන්නල දිමේ හැකියාව අපිට තියෙනවා ආඥා

පනතේ විධිවිධාන අනුව ඒක තියෙනවා. ඒ නිසා මම කියන්නේ හිත්රිදවීම් සිදු වෙනවා නම් ඒ හිත් රිදවීම් ඇති නොවන ආකාරයට හැසිරෙන්න සභාව තුල. ඒ අපි කවුරුත් මන්ත්‍රීවරුන්ගේ ගෞරවයට බොහොම වැදගත්. අපි අපේ දේවල් කඩ කරලා අපි තව කෙනෙක්ගෙන් යහපත් දෙයක් බලාපොරොත්තු වෙන්න එපා. අපි සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ගෞරවයෙන්ඉල්ලනවා. අපි මෙතෙක් කල් එහෙම ප්‍රශ්ණ ඇති කරගෙන නැහැ. ඒ නිසා මුලසුන කථා කරන වෙලාවට අපිට කථා කරන්න අයිතියක් නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් දැනුවත් වෙලා ඉන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අපි මෙතුමාගේ කථාවේ ඔබතුමා කියපු ඇකියුරිටි බැලන්ස් නිරවුබව සන්කුලතාව දන්න නිසා තමයි ඒක න්‍යාය දන්න නිසා තමයි අපි අවස්ථාව දිල තියෙන්නේ. ඔබතුමා හැමදාම ආයාචනා පෙත්සම් යටතේ රීති ප්‍රශ්ණ මතුකරනවනේ. ඒ රීති ප්‍රශ්ණ මතුකරන එකේ සාධාරණ බව පෙනෙන නිසා තමයි මෙච්චර වෙලා හිටියේ. එතුමා කථා කරන කොට මුලසුනට ගරු කරන්න ඕන බව අපි දන්නවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි මම මේ කියාගෙන එන එකේදි යම් යම් කරුනු මෙතන මම ඉන්නේ උඩ නිසා යම් ඉරියව්වෙන් පවා කරන දේ මට පේනවා උගත් නෝනා හිනාවෙන්න එපා. මේ සභාවට උසුලු විසුලු ඕනවට වඩා කරන්න එපා ඊලඟ පියවරටත් යන්න වෙනවා ඕවා කරන්න ගියොත්. ඒක නිසා ඒවා කරන්න යන්න එපා. හිනාවෙන්න කියන එකට පිහියෙන් අනින්න් හිනාවෙන්න පුලුවන්. ඔබතුමියගේ තියෙන ඔය දැනුම, අවබෝධය, උගත්කම සියලුම දේ ඔබතුමිය සතුව තියා ගන්නකෝ. මම කියාගෙන ආවේ කරුණාකරලා මාධ්‍යවේදියෙක් මේ සභාවේ කුමන විදියකට මන්ත්‍රීවරයෙකුට, නගරාධිපතිවරයාට, උපනගරාධිපතිවරයාට, කුමන හෝ නිලධාරියෙකුට. කුමන හෝ චෝදනාවක් නගනවානම් ඒ නගන්න ඕන විදියක් තියෙනවා. ඒ පිලිබඳව අපට තියෙනවා ප්‍රශ්ණයක්. සම්පූර්ණවම අපි කියමු යම් කෙනෙක් ප්‍රකාශයක් කලාම ඒ ප්‍රකාශය පල වෙනකොට අපි කියමු මාටින් මාමා කථා කරපු එකක් මේ සභාවේ අපිට කථා කරන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා දන්නවානේ. හැබැයි යම්කිසි මන්ත්‍රීවරයෙක් ප්‍රකාශයක් කලාම ඒ ප්‍රකාශයේ වැදගත් භාවය ඒ පිලිබඳව කථා කිරිමට අයිතියක් තියෙනවා. ඒක නිසාම මම කියන්නේ කරුණාකරලා මේ වගේ දේවල් පලකරනකොට මන්ත්‍රීවරුත් තමන්ගේ පැත්තේ ඉඳගෙන කොයිතරම් දුරට තමන් නිර්දෝෂ වෙනවද කියලා බලාගෙන

ඉදලා ඒ කටයුත්ත කරන එකත් මන්ත්‍රීවරයාගේ වගකීම. මොකද මම කවදාවත් ඔය කටයුත්ත කරලම නැහැ මට පුරුද්දක් නැහැ එහෙම. කියන්න ඕන දේ ගරු රවිනාත් ගුණසේකර මැතිතුමා සමඟ උඩට ගිහිල්ලා කථා කරනවා, උපනගරාධිපතිතුමා සමඟ උඩට ගිහිල්ලා කථා කරලා අපි වැඩේ කලා. ඒ විතරක් නොවෙයි අපි මහන්සි වෙලා යම් යම් දේවල් සභාවට පාඩු වෙන යම් යම් තැන් වලදි වාසි කර ගන්න අපි උදවු කලා. අපි ඒවා එහෙම තමයි කලේ. කොතන හිටියත් සභාවට පාඩු නොවන යම් දෙයක් කරනකොට ජනතාව දන්නවා මේ කථා කරනවට වඩා අපි හෙට ගිහිල්ලා මාධ්‍ය සාකච්ජාවක් තියලා ජනතා විමුක්ති පෙරමුණ මන්ත්‍රීවරයාට ගෙවන්න තියෙනවා මෙච්චරක් විගණනයෙන් කියලා තියෙන්නේ අධිභාරයක් තියෙනවා කියන එක අපිට අවස්ථාවක් තියෙන්න එපැයි. මම දැන් කියනවද විගණනය වැරදියි කියලා නැහැ. වැරදි නැහැ ඒක නිවැරදි කර ගන්න ඕන. හැබැයි වරැද්ද තුල එයා ඉදගෙන ඒ වැරැද්ද අපිට පටවනාව නම් සභාවෙන්ම ඒක බේර ගන්න ඕන. ඒක සභාවේ ප්‍රශ්ණයක්. මේක එලියේ තියෙන ප්‍රශ්ණයක් නොවෙයි.ඒක නිසා මම කිව්වේ කරුණාකරලා ඒවගේ කථා කරනකොට මීට වඩා ඒවගේම මාධ්‍ය වේදින් විදියට මිට වඩා දැනුමක් ලබාන්න ඕන අපිට ඒ කලාව පිලිබඳව ලොකු අවබෝධයක් නැති වුනාට අපි දන්නා දෙය තමයි යම්කිසි දෙයක් විමසීමේදි ඕනම මාධ්‍යක් මම එහෙම කරලත් තියෙනවා සමහර මධ්‍යන් අපිට ඇහුම්කම් දිලා ඒක කරල තියෙනවා. සිරසට කථා කරලා අපි කියනකොට ඔබතුමන්ලා මෙහෙම දැම්මා විමසීමක් කරන්නේ නැද්ද කිවුවම අපෙන් අහලා කරලා තියෙනවා. මේ ඇහුම්කම් දිමක් නැතුව අර ගොනා වලං ගොඩට පැන්නා වගේ එහෙම මාධ්‍ය ඒ විදියට හසුරුවනවා නම් අපි ගොනාව බැදල තියන්න වෙනවා. මෙන්න මේ කාරනාව ගරු සුජිත් පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා ඔබතුමාගේ කරුණු මත අනිවාර්ය්‍යයෙන්ම මෙය වාර්තාගත යුතු වෙනවා

ගරු මන්ත්‍රීතුමා, ලියන 194 ක් සභාවට අයකර ගැනිම කියන එකේදි මෙතුමන්ලා නොදන්නවා වුනාට ඒකෙදි සම්පූර්ණයෙන්ම විගණන විමසුම් වෙලාවන්වලදි අපි ඒවාට උත්තර සපයලා තියෙනවා. ඒක නිසා මේවා නගරාධිපතිවරයාගේ කටයුත්තක් නොවෙයි හැබැයි වග කියනවා නගරාධිපතිවරයා. ගණන් බලන නිලධාරියාට වග කියනවා මේවා නිලධාරින් මගිනුත් ඉටු කර ගන්නට බැරි උදාහරණයකට ගත්තොත් රජයේ ආයතනවල තියෙන්නාවු වරිපනම් මේකට ඇතුලත් වෙලා තියෙනවා. සමහර ලේඛන තියෙනවා. උදාහරණයකට ගත්තොත් අවුරුදු 10 කට කලින් කරපු ව්‍යාපාරයක් දැන් නැති වෙලා තියෙනවා. අයකර ගන්න බැරි වෙලා තියෙනවා.

ඒ වගේ දේවල් මේ මිලියන 194 තුල සම්පූර්ණයෙන්ම අන්තර්ගත වෙලා තියෙනවා.ඊට පස්සේ ආදායම් එකතු කිරිම සම්බන්ධයෙන් මම හිතනවා මේ දවස්වල ආදායම් එකතුකර ගන්න ඔය කියන විදියට අපි අපොහොසත් වෙලා තියෙනවද කියන එක නගරාධිපතිවරයා විදියට මම හිතන්නේ තව දුරටත් ලොකු අපිට ප්‍රසිද්ධිය එක්ක දෙනවා නම් මම හිතන්නේ හොඳයි කියලා. ආදායම් එකතු කිරිම අපි තරම් විදිමත් විදියට මිනිස්සුන්ට සහන දිලා ආදායම් එකතු කරන පලාත් පාලන ආයතනයක් තියෙනවා නම් මම කිව්වේ මම ඉල්ලා අස්වෙනවා කියලා. කවුරුහරි කියනවා නම් ලංකාවේ මෙන්න මෙහෙම තැනක තියෙනවා කියලා අතීතය අවුරුදු 40 කට,30 කට,10 කට එහා ගිය වරිපනම් වලට එහා ගිය වරිපනම් වලට 10% ක් වට්ටම් දෙනවා කියලා කවුරු හරි කියනවානම් කරලා තියෙන තැනක් තියෙනවා කියලා ඉල්ලා අස්විමේ ලියුම දිල මම යනවා. අන්න ඒ වගකිම නගරාධිපතිවරයා අරගෙන තියෙනවා. මිනිස්සුන්ට සහන දි දි වරිපනම් බදු එකතු කරන ලංකාවේ තියෙන එකම ආයතනය මෙච්චරයි. ඒක නීතියට පරිභාහිරව නොවේ නම් කවදාවත් විගණනය වෙලා නැහැනේ. නගර සභාව වට්ටම් දෙන්න බැරි අවස්ථාවලදි වට්ටම් දිලා ආදායම් අහිමි කරගෙන කියලා විගණනය වෙලා නැහැනේ. ඒක සම්පූර්ණ බොරු. එහෙම එකක් නැහැ. වරිපනම් බදු අරකර ගැනිම ඔබතුමන්ලා නොදන්නවා වුනාට රවිනාත් ගුණසේකර මැතිතුමාගේ කාලේ එතුමා දන්නවා එතුමාට ලොකු ප්‍රශ්ණයක් බවටත් ඒක පත්වෙලා තිබුනා ඔබතුමා දන්නවා අපිට හැමදාම 55% - 60% ට වැඩියේ වරිපනම් බදු එකතු වෙන්නේ නැති නිසා වැටුප් ප්‍රතිපර්ණය කිරිමට ඔබතුමාගේ කාලේ 65% -70% යි දුන්නේ ඔබතුමාට තනිකර ආදායම දැන් මම වැඩ කරනවා වගේ ඔබතුමන්ලාට වැඩ කරන්න බැරි වුන පලවෙනි කාරණාව තමයි ඔබතුමාට වැටුප් ප්‍රතිපූර්ණය කරනකොට 70% යි උපරිමය දිලා තියෙන්නේ. 30% ක් ඔබතුමාට දෙන්නේ නැහැ. අද 100% ම දෙනවා. අද වැටුප් ප්‍රතිපර්ණය අපේ වරිපනම් ආදායම 60% ක් වුනත් 55% ක් වුනත් ඔබතුමාගේ කාලේ ඔබතුමාට දුන්නේ නැහැ ගරු මැතිතුමා. ඒක මම දන්නවා ඒක නිසා ඔබතුමාට විශාල ධනස්කන්ධයක් අහිමි වුනා. හැම අවුරුද්දෙම ඔබතුමාට ලක්ෂ 700 – 800 ක් ප්‍රතිපූර්ණ වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඒවත් එක්ක ෆයිට් කලා.මේ කවුරුත් දන්නේ නැති වුනාට ඒවා දන්නේ ඒ පරිනත වෙච්ච අවබෝධයක් තියෙන්න අය. ඒවට අපි ෆයිට් කලා එහෙම ෆයිට් කරපු නිසා තමයි අද ප්‍රතිපූර්ණ 100% ක් හම්බවෙන්නේ.ඒ නිසා කරුනාකරලා මේවා ඇඟිලි දික් කරන්න ඕන ආදායම එකතු කර ගන්න නොදන්න ආදායම එකතු කර ගැනිම නගරාධිපති කාර්්යයක් ඒක කරලා නැහැ. ඒකට හොඳ සාක්ෂියක් තමයි මම මේවා කිව්වේ. අපි ඒවා යන්න පුලුවන් උපරිමය දක්වා ගියා. ඒවා යහපාලන ආණ්ඩුව

කාලෙක් අපි ඒ උපරිමයට ගියා. ඒ විතරක් නොවෙයි රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමතිතුමා එක්ක කථා කරලා කාලාවරෝධය කියන එක අවුරුද්දයි ඔබතුමාගේ කාලේ තිබුනේ. අපිට ගොඩක්මුද්දර ආදායම අහිමි වෙලා තිබුනා. මම ඒක අවුරුදු 5 දක්වා වැඩි කලා සජිත් දුමින්ද පිරිස් මන්ත්‍රීතුමා දන්නවා. ඒ ආදායම එකතුකර ගැනිමට ගිහිල්ලා.අපිට අද දෙයියනේ කියලා එක්දාස් පන්සියක් එක්දාස් තුන්සියක් විතර මුද්දර ආදායමක් එන තත්වයට අපි ගෙනිච්චා. වෙන දවස් වල අවුරුද්දෙන් ඒක ගත්තේ නැති වුනා නම් ඒක අපේ ආදායමක් නොවෙයි පලාත් සභාවේ ආදායමක් විදියට ගියා. එහෙම අපිට තමයි කියන්නේ ආදායම එකතු කර ගැනිම අපොහොසත් කියලා. මේක කියන්නන් කාලේ කිව්වම මාධ්‍ය වේදින් අපෙන් ඇහුවා නම් අපි ඕක කියනවානේ. මෙන්න ආදායම එකතු කිරිම අපි කරපු කාර්ය. අපි කරපු කාර්ය මොකක්ද කියලා. එහෙම නැතුව මේ වලං ගොඩට පැන්න ගොනා වගේ මේවා ලියාගෙන ලියාගෙන ගියාට හරියන්නේ නැහැ. එතුමා 97 සිට ඉන්නවා එතුමත් ඒක දන්නවානේ. ඒක කියනකොට එතුමා අනිත් පැත්ත හැරිලා බලන්න ඕන දැන් මේක මම කියන එක හරද. ඒ කාලේ මේක කලේ නැහැ.මේ කාලේ කලා එතුමාටත් තිබුනා ඒක නොකියා ඉන්න. කියනවානම් කියන විදියක් තියෙනවා. මේක මේ විදියට අපේ සභාව මෙහෙයවන්න අපේ සභාවේ වැරදි තොරතුරු අපේ මනෝජ් මන්ත්‍රීතුමා කිව්වෙත් වැරද්දක් නොවෙයි මනෝජ් මන්ත්‍රීතුමා කවුරුත් කැමතියි මොකක් හරි කරලා ස්තුතියි කියලා අහගන්න. ඕක තමයිනේ දේශපලඥයින්ට තියෙන අවසාන ඉලක්කම. හැබැයි එතකොට ඒකත් ඔබතුමා කියපු එක හරි. අපේ තිලකසිරි මන්ත්‍රීතුමා කථා කලා අන්තිමට එතනට ගිහිල්ලා අපි නිසා මේක වුනා කියන තැනට පත්වෙන්න ගියා. කවුද ඒක ඒ නිසා කලේ නැහැ. මම අදටත් ඒ මුදල් ටික නිසි පරිදි බැදලා නිසි පරිදි කුණු ටික බැවෙන්නැත්නම් හෙටත් මම නවත්වනවා. ඒ මගේ නගර සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ කුණු ටික දෙනවද තෝරන්නේ නැතුව මන්ත්‍රීතුමා.මන්ත්‍රීතුමාලා වරිපනම් ගෙවන්නේ නැද්ද. ඒක නිසා මේ සභාවේ මන්ත්‍රීවරු වැඩ කරන්න ඕන සභාව ගැන හිත හිත. හැබැයි විගණනය ගැන කියනකොට කියනවා අදායම එකතු කලේ නැහැ කියලා.කුණු ටික තෝරන කොට සභාවේ වෙන විදියක් පොලට ගියාම එක විදියක් එහෙම කරන්න බැහැ.ගරු සජිත් මන්ත්‍රීතුමා වරිපනම් බදු ගෙවන් නැති ව්‍යාපාර බදු ගෙවන්නේ නැති පොලක කුණු ටික වත් තෝරලා දෙන්නේ නැතිව අපි අදින්න අපිට මොකක්ද තියෙන මේවා කථා කරන්න ගියාම එකින් එක මේ වැරදි නිවැරදි කර ගන්න ඕන.ඒක නිසා යම් විදියකට සිත් තැවුලකට පත් වුනා නම් යම් විදියකින් මගේ වචනයකින් හරි ඒ පිලිබදව මම කණගාටු වෙනවා. හැබැයි මමත් අවුරුදු 16 ක් මෙතන ඉදගෙන මම දන්නවා මේ සභාවේ අබමල්

රේණුවකටවත් මේ සභාවට අහිතක් වෙන්න වැඩක් කරලා නැහැ. මේ තෙමෙන වහලේ පවා උලු කැට පවා මාරුකරලා තියෙනවා මම. මගේ වහලේ පවා උලු කැට මම මාරු කර ගත්තා මම. කවුරුත් දන්නේ නහැ උදේ පාන්දර ඇවිල්ලා උඩට නැගලා උලු මාරු කරලා තියෙනවා. මම කුණු ඇදලා තියෙනවා මේ අත් දෙකෙන් තව පොඩ්ඩෙන් වෙඩි තියලා මරනවා මාවයි සුජිත් පුෂ්ප කුමාර මන්ත්‍රීතුමාවයි 2006 අප්‍රේල් මාසේ 17 වගේ දවසක. අපි දන්නේ නැහැ බැංකුවක වාහනයක් එනවා අපි මැද්දට පැන්නා අපට පාට් එක දාපු නිසා බලනකොට ටී 56 4 ක් අරගෙන එලියට බැස්සා. කුණු අදින මිනිස්සුන්ට අරියාදුවක් කරලා එගොල්ලෝ ගිය නිසා කරුවලේ මැරුනා.ඒක නිසා සභාවට තියෙන ලෙන්ගතු කම නම් කියන්න වචන ඕන නැහැ. නමුත් ඒක පැත්තකට දාලා යම් යම් විදියට දෝෂාරෝපණයට ලක් කරනකොට තමුනුත් නිවැරදි වෙලා ඒවා කලා නම් හොඳයි.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මාධ්‍යවේදීන් මේවා ලියනවානම් මම හිතනවා අද දිනයේදී ගරු ලේකම්තුමා ඔබතුමාගේ විශේෂ කාර්යභාරයක් වෙන්න ඕනෑ. මේ මාධ්‍ය වලදී ප්‍රධාන කතෘ තුමන්ලාට මේ විදියට ලියලා තියෙනවා. බැලන්ස් නොවිම මත ලියලා තියෙන එක ප්‍රධාන කතෘ තුමාට දන්වන්න. මේ වගේ අයව ඔබගේ ආයතනයෙන් අපේ සභාවට එවන්නේ නැතුව මේ සභාව තුල ඔබගේ ආයතනයේ ගෞරවය රැකෙන පරිදි මාධ්‍ය බැලන්ස් කිරිමට කරන්න පුලුවන් අයව මේකට එවන්න එහෙම නැති වුනොත් මම හිතනවා අපිට ප්‍රතික්ෂේප කරන්න වෙනවා. අපි ගාව එකක් දෙකක් තුනක් හතරක් නොවෙයි කරුණු 100-200 ක් විතර තියෙනවා මේ එක පැත්තක් උදෙසා ලියන වාර්තාවල් අපි ගාව තියෙනවා. ඒක නිසා ඔබතුමා කරුනාකරලා මේ පිලිබඳව ප්‍රධාන කතෘන්ට ලියන්න සමබරතාවය ආරක්ෂා කර ගැනිම සඳහා මාධ්‍යට ලිවිම සඳහා ඔවුන්ගේ ආයතන වලින් සභාවට එවන කවුරු හෝ සභාව ඔවුන්ට ආවරණය කිරිමේ දිලා තියෙන ඒ අවස්ථාව පැහැර හැරිමක් නොවෙයි ලියන එක නිවැරදි කරගෙන එතුමියට එන්න පුලුවන් නම් එතුමියට එන්න පුලුවන් නම් අපිට කමක් නැහැ. නිවැරදි කර ගන්නේ නැත්නම් එතුමන්ලාව එවන්න එපා කියන එක දැනුවත් විම කරන්න.

**03(3)** <u>**මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ආයාචනා හා පෙත්සම් හමුවේ කීපයක්ම ඉදිරිපත් කරන්න තියෙනවා. ප්‍රථමයෙන්ම අභිනවයෙන් තේරි පත් වුනු විපක්ෂ නායක හිටපු නගරාධිපති හිටපු පලාත් සභා මන්ත්‍රී මොරටු නගරයට විශාල සේවයක් කරපු රවිනාත් ගුණසේකර මැතිතුමාට විපක්ෂ කණ්ඩායම් මන්ත්‍රීවරු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සහ විපක්ෂ කණ්ඩායම් සංවිධායක විදියට සුභ

පතනවා. ඒවගේම මේ අවස්ථාවට අද දිනයේ නවක මන්ත්‍රීවරයෙක් විදියට තේරි පත්වුනු හිටපු නගර සභා මන්ත්‍රී චන්ද්‍ර ගාමිනි මන්ත්‍රීතුමන්ට මාගේ සුභාශිංශන පල කරන අතර එක්සත් ජාතික පක්ෂයේ නාගරික මන්ත්‍රීවරුන්ගේ සුභාශිංශනය මේ අවස්ථාවේදි පල කරන්නට ඕන.

ගරු නගරාධිපතිතුමනි, කොවිඩ් නිසා මාස කීපයක් පාසැල් වහලා තිබුනා දැන් නැවත විවෘත්ත කරමින් යනවා ඒ නිසා මගේ කොට්ඨාශයේ තිබෙන සභිරා විද්‍යාලයේ පිරිසිදු කිරිම් කල කුණු ගොඩ තැනක තියෙනවා

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මම නැවත නැවත කියනවා ඔබතුමා ඉන්නේ පාසලේ නොවෙයි මේ ආයතනයේ. මේ ආයතනයට දිව්‍යඥානය නැහැ. මේ ආයතනයේ නගරාධිපතිවරයාට ලියුමක් ලියලා අපි මේක ශුද්ධ කලා කුණු ටික ගෙනියන්න කියලා කියන්නේ නැතුව අපි දන්නේ කොහොමද.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මම ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමාට කිව්වා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේ සභාවේ මන්ත්‍රීවරයෙක්නේ. ඔබතුමා මේ සභාවේ ගරුත්වය මුලින්ම ආරක්ෂා කර ගන්න. ඔබතුමා නොදන්නවා ත් ඇති දන්නවාත් ඇති මේ සභාවේ ගරු කොමසාරිස් පාලනයට ගිය කාලේ මගේ මැණියන්ගේ බණ පිංකම තියෙන වෙලාවේ පටවා ගත්ත කොඩි කණු ටික කොමසාරිස්තුමා ලිඛිතව ඉල්ලලා නැහැයි කියලා කොඩිකණු ටික බෑවා. මේ නගරාධිපතිවරයා එතකොට දෙවතාවක් නගරාධිපති වෙලා ඉන්නකොට අපි කියන්නේ මේක දෙන්න බැරි කමක් කරන්න බැරි කමක් නොවෙයි මේකත් ආයතනයක්. ඒ විදුහල්පතිතුමාට කියන්න ඕන ලිඛිතව නගරාධිපතිතුමා ලිපියක් ඉදිරිපත් කරන්න. එතකොට අපි ඕකේ. මේ ලංකාවේ මේ විදියට පාසල්,පල්ලි, පාසැල් වලට වැඩ කරන වෙන පලාත් පාලන ආයතනයක් තියෙනවා නම් හොයාගෙන එන්න. ඔබතුමත් ඒ ගරු සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට ඉන්නවා.

**03(4)** **<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මම විටින් විට කියනවා කල්දමුල්ලේ පාරවල් කැඩිලා. දැන් කඨින පෙරහැර පිංකම් කරන කාලය ඔබතුමාලගේ ලක්ෂ 66 ක්ම වැඩිපුරම දුන්නේ සිංහල බෞද්ධ ජන්ද. හාමුදුරුවෝ මුලිකත්වය වෙලා ඔබතුමාලගේ

ආණ්ඩුවක් ගෙනාව. නමුත් දැන් අපිට කියනවා කඨින පිංකම් යන කාලේ පාරක්වත් හදන්න බැරි සභාවක්ද . මම කිව්වා පුලුවන් කමක් තියෙනවා නම් කැඩිලා තියෙන තැන් හරි අපි හදමු කියලා. පුලුවන් කමක් තියෙනවා නම්මම ඉල්ලීමක් කරනවා හෙට පුලිනතරාරාම විහාරස්ථානය කඨින චීවරය රැගෙන යන පෙරහැර. එම

නිසා දහම් මාවතේ 11 වන පටුමගේ පිලිසකර කර දෙන්න කියලා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඇයි ඔබතුමා ඔය විදියට කථා කරන්නේ තිලකසිරි මන්ත්‍රීතුමා, සුරංග මන්ත්‍රීතුමා, ප්‍රිදිප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා,උපනගරාධිපතිතුමා තාමත් එක පාරක්වත් කාපට් කරන්නේ නැතිව ඉන්නවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, දැන් මේ වැසි කාලය අපේ ධූමායන මැෂින් දෙකම හදලද තියෙන්නේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, එකක් හදලා තියෙන්නේ. අපිට වුවමනාව තිබුනට මැෂින් ගන්න නැහැ.

**03(5) <u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා,දැන් ඩෙංගු ව්‍යාප්තිය වැඩි වෙලා තියෙනවා. සභාවක් විදියට අපි අවම කර ගන්න ඕන. එම නිසා ගරු නගරාධිපතිතුමනි අපි අපේ වගකීම අතට අරගෙන ඒ කටයුතු කරන්න කියලා මේ අවස්ථාවේදි ඔබතුමාට ප්‍රකාශ කරනවා.

**03(6) <u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඒවගේම ලුනාව කලපුවේ මෝය කට කොළඹ දෙසට යන ඇල මාර්ගය විටින් විට වැසි කාලයේදි පිටාර ගලන්න බලනවා. ගෙවල් වලට වතුර දාල තියෙනවා නගරාධිපතිතුමනි. මේ සභාවනේ ඒකට වගකීම තියෙන්නේ.මෙය විධිමත් ආකාරයට යන්න ඕන අපි ඒ ජනතාවට අපි විශ්වාසය ඇති කරන්න ඕන. එම නිසා ඒ සම්බන්ධව ඉක්මනින් කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**03(7) <u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඉඩම පීරිස් මාවත ගඟ පල්ලෙහි ගඟ රක්ෂිතය මට දැන ගන්න ලැබුනා ගොඩ කිරිමකට ලක් වෙනවා කියලා. මම දන්නේ නැහැ කවුද කරන්නේ කියලා. මේ වගේ රක්ෂිතය ගොඩ උනාම හානි සිදුවන්නේ ඒ නිවැසියන්ට.සභාවක් විදියට එය සොයා බලා කටයුතු කරන්න කියලා මම වගකිමෙන් කියනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, අපේ ඉංජිනේරු දෙපාර්තමේන්තුව මෙතුමා කියන ගඟ ගොඩ කිරිම සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම වාර්තාවක් සටහන් කරලා අද දිනයේ සභාවේ මතුවුන කරුණක් අනුව කියලා ලිපි ගොනුව පටන් අරගෙන ඒ කටයුතු කරන්න සභාවේ කොපමණ කිව්වත් ලිපිගොනුවක් අරින්නේ නැහැ. කරන ලද පැමිණිල්ල අනුව කියලා ලිපිගොනුවක් ආරම්භ කරලා ඉදිරි කටයුතු කිරිම අද දිනෙන් ආරම්භ කරන්න.

**03(8)** <u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අනුරසිරි මන්ත්‍රිතුමා කිවුවා වගේම දැන් වැසි කාලය ඇවිල්ලා තියෙන්නේ. එම නිසා නැවත වතාවක් අපිට ඩෙංගු රැස්වීම පවත්වන්න වෙලා තියෙනවා. සිකුරාදා පවත්වන්නේ එම නිසා මම කොමසාරිස්තුමාට ඉල්ලිමක් කරනවා රාජ්‍ය ආයතන වලට දැනුම් දිලා අනිවාර්යයෙන්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල දෙකම, මොරටුව විශ්වවිද්‍යාලය, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දැනුම් දිලා වෛද්‍යවරු ඒ වාර්තා එක්ක ඩෙංගු කමිටුව ආරම්භ කරන්න කියලා.මොකද දිගින් දිගටම නගර සභාවට තමයි කවුරුත් ඇඟිල්ල දික් කරන්නේ.

**03(9)** <u>මහ නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ මන්ත්‍රිතුමා කියපු කතාව ඇත්තටම සත්‍යක් ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමාගේ කථාව සමහර අවස්ථාවල නගරාධිපතිතුමාගේ හිතවතුන් නගරාධිපතිතුමා දන්නවා කිව්වා කියලා එවැනි දේවල් කරනවා. නමුත් එතන ප්‍රශ්ණාර්තයක් ආවා අදාල ස්ථානයේ නිලධාරින් නොදැනුවත්ව ගෙනියනවා කියලා ඒක ඔබතුමා සොයා බැලිය යුතුමයි. හේතුව සමහර විට කුණු බානවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, මෙහෙම දෙයක් තියෙනවා සමහර වෙලාවට අපේ සමහර අවශ්‍යතාවයන් තියෙනවා උදාහරනයකට කියනවා හෙට යනවා සොරෝල

මංගලය යනවා මෙන්ඩිස් පාරේ සාමානයයෙන් මෙන්ඩිස් පාරේ යනවනේ.එතන ස්ලැබ් එකක් කැඩිලා කර්මාන්ත අංශයට කියලා ස්ලැබ් එකක් හදන්න ගියොත් වැඩේ කරන්න බැරි නිසා මම කියනවා මිනිස්සුන්ට පාවිච්චි කරන්නට නොහැකි වෙන්නාවූ ඒවා ගේන්න කියලා. මම ගිය සතියෙත් කිව්වා ඒ අවස්ථාවට ගෙනාවද දන්නේ නැහැ.හැබැයි ඒවා ගෙනල්ලා දාපු තැන් අපි ගාව තියෙනවා. ඒවා අපි ඕන තරම් කරනවා හේතුව ලූනාව කලපු ව්‍යාපෘතියේ ඔය වගේ ස්ලැබ් කැලි දැම්මා ලක්ෂ 50 – 100 ක වගේ. ඒ වගේ තැන් වලින් ගෙනල්ලා කිසිම පරිහරණයක් කරන්නේ නැති ගේට්ටුවක් නැති තැන් වලට දාලා තියෙනවා. යම් යම් තැන් වලට ඕන තරම් දාන තැන් තියෙනවා. හෙට මම බලලා කියනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, නගරාධිපතිතුමා කියන කථාව සම්පූර්ණ හරි. මොකද හේතුව ඔබතුමාට අයිතියක් තියෙනවා එහෙම කරන්න මන්ත්‍රීවරයෙක් වශයෙන් අපිටත් ඒ අයිතිය තියෙන්න පුලුවන්. නමුත් ඒ ගෙනියන තැන කෙනෙක් ඉන්නවානේ ඒ වගකිම අරගෙන කියන්න ඕන නගරාධිපතිතුමාගේ උපදෙස් මත ගෙනිච්චා කියලා. මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා අරගෙන ගියත් ඔබතුමාට තමයි ඒ දොස් එන්නේ. කවුරුවත් දන්නේ නැහැ ඒ කතා. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා පමණයි ෆෝන් එකක් උස්සන්නේ. වෙන කිසි මහජන සෞඛ්‍ය පරික්ෂක කෙනෙක් වත් උස්සන්නේ නැහැ වෙන දෙයක් වත් අහන්න. සමහර එස් ඩබ්ලිව් එහෙමයි ඒ ප්‍රශ්ණය හැම තැනම තියෙනවා. මම ඉංජිනේරුතුමිය එක්කත් කථා කලෙත් මිනිස්සුන්ගේ ප්‍රශ්ණය ගැන.

**03(10)** <u>**මහ නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඒ වගේම තවත් විශේෂ දෙයක් තියෙනවා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අපි කාටත් මේ දිනවල පෝලිම් වැස්ස තිබුනත් එහෙමයි. වාහනයක් නවත්වන්න තැනක් වත් නැහැ. ඔබතුමා ගියොත් ඔබතුමාගේ වාහනය ඇතුලට ගන්න පුලුවන් තත්වයක් නොවෙයි එතන තියෙන්නේ. පිටිපස්සේ ඉඩ තියෙනවා. ඉස්සරහ කොටසේ සිකියුරිටි එක්කෙනා විතරයි ඉන්නේ. ඒ කොටස ඇරලා එන වාහන දාන්න හරි ලෑස්ති කරලා දෙන්න. අපිට ඇතුලට යන්න පුලුවන් අපිට ජන්දය දුන්න අය හිටියම මේක කියන්න මේක කියන්න කියනවා අපිට කියනවා. අන්න ඒක නැති කරන්න ගරු නගරාධිපතිතුමා මොකද හේතුව ගොඩනැගිල්ලක් හදන්න ගියාම අපි දන්නවා වාහන නැවතුම් ස්ථාන තියන්න කියනවා. පොලිසියට ප්‍රශ්ණ බේරන්න වුනේ. අපිට කථා කරන්න බැහැ ඔයගොල්ලෝ තමයි නීති හදන

තැන ඉන්නේ කියලා කියනවා. ජනතාව ඇවිදින්න බැරි අය එනවා අඩුම තරමින් වාඩිවෙන්න තැනක් හදලා දෙන්න කියලා ඉතාම ඕනෑ කමින් ඉල්ලා සිටිනවා.

**03(11)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ගිය සභාවේදි මම පෙත්සමක් ඉදිරිපත් කලා ගොඩනැගිල්ලක් සම්බන්ධව මේ පෙත්සම සම්බන්ධව මම විමසීමක් කලා ඔබතුමා ඒක ලේකම් අංශයට භාර දිලා දැන් සැලසුම් අංශයට ඇවිල්ලා තියෙනවා එතනදි අදාල ටි. ඕ. මහත්මයා දන්නේ නැහැ දැනට මොකක්ද වෙන්නේ කියලා. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා ජනතාව විසින් ඉදිරිපත් කරන පෙත්සම් වලට මීට වඩා යම්කිසි ක්‍රමවේදයක් ඇති කරන්න කියන ඉල්ලිම කරනවා. කඩලාන ශාන්ත අන්තෝනි දෙව්මැදුර ඉදිරිපිට සිව්මල් ගොඩනැගිල්ලේ සැලසුම පිලිබද ප්‍රශ්ණයක් තියෙනවා අඩුම තරමින් සභාවක සිට මේ සභාවට එනකොට වත් ඔබතුමා මීට පෙර අපිට දුන්නා පෙත්සම් වලට වෙන්නේ මොකක්ද කියලා අදාල මන්ත්‍රිවරයා දැනුවත් කලා. එය ඉතාමත් හොඳ කාර්යක්

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ලබන මාසේ සිට කලින් විදියටම මම නැවත එය පටන් ගන්නවා.

**03(12)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ලිඛිත පැමිණිල්ලක් තියෙනවා බැසිල් විල්ප්‍රඩ් ද මැල් කියන මහත්මයා ඉදිරිපත් කරන්නේ. ඔබතුමා දන්නවා තිබුනු සමෘද්ධි බැංකුව කඩලාන මේ ගොඩනැගිල්ලෙඅයිතිය පිලිබදව ප්‍රශ්ණය අපි දන්නවා. එදා ට්‍රාන්ස්පෝමර් වත්ත කියලා කියන්නේ. මගේ පියා ගේ කාලයේදි ඒ අය ලිඛිතව නගර සභාවට දිලා තිබුනා කුඩා බිම් කඩක්. 94 න් පසුව සමෘද්ධි ව්‍යාපාරයත් සමඟ එතන ගොඩනැගිල්ලක් ඉදිවුනා. මේ මහත්මයා කියන්නේ අයිතිය පිලිබද අපේආයතනයත් එක්ක ඒක හරි. මෙතන මෙහෙම දෙයක් කියනවා 2011 දි මෙතුමා සමෘද්ධි බැංකුව තියෙන නිසා මේ ඉඩම ප්‍රාදේශිය ලේකම් තුමාට තමයි අයිතිය කියලා තමයි හිතලා තියෙන්නේ.2010.12.09 වෙනිදා ලිපියක් දෙනවා. මෙකේ අවදානම් තත්වයක් තියෙනවා මේ ගොඩනැගිල්ල, තාප්පය සම්න්ධව. අලුත්වැඩියාවක් කරන්න සුදුසු තත්වයේ තියෙනවද දන්නේ නැහැ. ඒ පිලිබදව තාක්ෂණික වාර්තාවක් ගන්න වෙයි. මෙතුමා 2010 දිත් පැමිණිල්ලක් කරනවා. මෑත කාලයේදි නැවත පැමිණිල්ලක් කලා මම

කොමසාරිස්තුමාට එය ඉදිරිපත් කලා. ඒ සම්බන්ධව අවධානය යොමු කරලා ඒක අපිට අයිති නම් අපි සතු නම් ඒ ගොඩනැගිල්ල යම් කිසි මට්ටමක කඩා වැටුනොත් මේ අයගේ ජීවිත සම්බන්ධව ලොකු ප්‍රශ්ණයක් තියෙනවා. ඒකේ වගකීමත් අපි ගන්න ඕන අපිට අයිති නම්. ඔබතුමාගෙන් මම කාරුනිකව ඉල්ලා සිටිනවා මේ පෙත්සම පිලිබදව අවදානය යොමු කරලා අවශ්‍ය පියවර ගන්න කියලා.

**03(13)** <u>**මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඒ වගේම ගරු ගල්පොත්ත පාර පටන් ගන්නා තැන සිට යම් කිසි දුරකට ඒ කාණු පද්ධතිය හදලා තියෙනවා. මේ පාරත් අපි උඩට යන පාරත් අතර ස්ලැබ් කැලි අතර ප්‍රශ්ණයක් තියෙනවා. ටී ඕ මහත්මයාගෙන් අහුවම එතුමා කියනවා කොන්ත්‍රාත්තරුට වෙන් කරන ලද මුදල් ප්‍රමාණය සම්බන්ධ ගැටලුවක් තියෙනවා කියලා එතන අඩුවක් තියෙනවා කියලා එයා කරපු කාර්ය වැඩි කොටසක් කරලා දැන් මේකට යොමු වෙන්න බැරි ත්තවයක් කියන එකක් තමයි මට පැහැදිලි වුනේ. අපේ ප්‍රශ්ණයක් නොවෙයි පරණ ස්ලැබ් කැලි දෙකක් කැඩිලා තමයි කියන්නේ මේ පිලිබදව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලිම කරනවා.

**03(14)** <u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මේ දිනවල කොරෝනා අවධානම අඩු වෙලා තියෙන නිසා පක්ෂ විපක්ෂ භේදකින් තොරව ගත්තත් අපිට කරන්න පුලුවන් දේවල් කරලා යම් සාධනීය තත්වයක තියෙනවා ඒ පිලිබදව සතුටුයි. අනිත් එක අපි අවදානම් කලමනාකරනය යටතේ නොසලකා හරින්න නරකයි දිගින් දිගටම මේ ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වාගෙන යන ලෙස ඔබතුමාගෙන් ඉල්ලන අතර ඒ එක්කම මේවත් එක්ක පැන නගින අවශේෂ ප්‍රශ්ණ කීපයක් තියෙනවා ඒ තමයි ඩෙංගු ප්‍රශ්ණයත් ඉස්මතුවෙලා තියෙනවා. අපි රෝගී තත්වයන් හා මරණ අනුපාතය අඩු කර ගන්න රැස්වීම කමිටු පවත්වාගෙන යනවා වගේම, සංවහන වැසිත් වැඩි වෙලා තියෙන කාලෙක අපි නොදකින පැතිකඩ තමයි මී උණ තත්වය නිසා පසුගිය කාලේ තරුණයන් දෙදෙනෙක් මැරුනා. ඒ නිසා අපේ නගර සභාවේ වැඩ කරන සේවකයෝ මේ කාණු සමඟ කුණු සමඟ සිටින නිසා එන්නත් දිමේ කටයුතු ඔවුන්ට කරනවා වගේම සමස්ත මොරටුව ජනතාවටම මේ පිලිබද අවබෝධය ලබා දිය යුතුව තියෙනවා. තවත් එකක් එම් ජේ සි මාවතට හැරෙන තැන ස්ලැබ් කැලි දෙක්ක කැඩිලා තියෙනවා ඒ ගැන අවධානය යොමු කරමින් ප්‍රතිපාදන ලබා ගැනිමේදි ඒ සම්බන්ධවත් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**03(15)** <u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා,කසල කළමනාකරනය පිලිබඳව මොරටුව නගර සභාව යම් සාධනීය තැනක ඉන්නවා. ඒක අපි අවිවාදයෙන් පිලිගන්න ඕන දෙයක්.ඒ නිසා අපිට කොච්චර පාඩු වුනත් නැතත් අපි හෘද සාක්ෂියට එකඟව ඉන්න ඕන අපිත් කසල වෙන්කරමි ඒ ආදර්ශය දෙනවා. යම් කෙනෙක් එහෙම

කරන්නේ නැතුව නිදහසට කරුණු කියනවා නම් අපි ඔහුට කියන්න ඕන ඒක අපේ යුතුකමක්.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම මීට පෙරත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කලා ඔබතුමා ඒක මිනිට් එකක් දාලා අත්සන් කලා. මෝල්පේ කාණු පද්ධතිය විශ්ව විද්‍යාලය ලගින් පටන් ගෙන ෂෙඩ් එක ලගින් ඉවර වෙන පාරෙ කාණුව ඒ ජනතාව තමන්ගේ මුදල් වියදම් කරලා කාණුව හදාගත්තා. ඒක ශුද්ධ කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(16)** <u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කොරෝනා අවදානමත් එක්ක ජනතාව අසීරු තත්වයට පත් වුනා ආදායම් අඩු වුනා අපි ඔවුන්ගෙන් වෙළඳ බලපත්‍ර අයකිරිම කර ගන්නවා ඒක හොඳයි. තීරණයක අරගෙන තිබුන ඒ කාල පර්ච්ඡේදය තුල කසල සඳහා අයකිරිම් අඩු කරලා තියෙනවා ඒකට ස්තුතිවන්ත වෙනවා. අවසාන වශයෙන් අපේ විපක්ෂනායකතුමාට සුභපැතුම් එක් කරනවා. ඒවගේම අපේ චන්ද්‍ර ගාමිණී මන්ත්‍රීතුමාටත් සුභපැතුම් පුද කරනවා ඒවගේම අපේ නියෝජ්‍ය

කොමසාරිස්තුමා එතුමාගේ උපන් දිනය දිනයේදි එතුමාට සහකාර පලාත් පාලන කොමසාරිස්ධුරය ලැබුවා එතුමාටත් සුභාශිංශනය පවත්වන්න මේ වෙලාවේ අවස්ථාවක් බවට පත් කර ගන්නවා.

**03(17)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, ආයවනා පෙත්සම් යටතේ මට ලැබුනු ඉල්ලීමක් තියෙනවා සභාවට ඉදිරිපත් කරනවා. මොරටුමුල්ල තාපසාරාම පාරේ ජනතාව විසින් කාණු පද්ධතියේ අවහිරතාවය මත ජලය මාර්ග දෙපස පිටාර ගැලීම නිසා ජනතාව අපහසුවට පත් වි ඇති අවස්ථාවක් නො.19/1 තාපසාරාම පාර ලිපිනයේ ඉදිරියේ සිට විශාල ජල ධාරාවක් ගලාගෙන යනවා මම හිතන්නේ ඔබතුමාගේ

ඥාති සොහොයුරෙක් තමයි ඒ මඩුව කරන්නේ අත්සන් 30 කින් යුතුව ඉදිරිපත් කරලා

තියෙන්නේ. දිනපතා එම ස්ථානයෙන් ගමන් කරන ජනතාව වැටිලා බෙහෙත් කරන තත්වයක් පත් වෙලා තියෙනවා. බදු ගෙවන මොරටුමුල්ල ජනතාව විදියට එය ඉදිරිපත් කරන ලෙස මා ගෙන් ඉල්ලිමක් කරලා තියෙනවා. විශේෂයෙන් ස්තුතියක් කරන්න කියලා මොරටුමුල්ල ජනතාව කියා සිටියා.විශේෂයෙන්ම කුණු ඉවත් කිරිම සම්බන්ධයෙන්.

**03(18)** <u>**මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ලලිත් අබේසේකර අංක 11/7 උයන පටුමග 1පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තියෙනවා වැස්ස කාලෙට කලපුව පිරිලා කාණු දිගේ වතුර ගලාගෙන එනවා. කාණු ප්‍රමාණය යටට තියෙන්නේ ඒක උස්සලා මේ ජනතාවගේ අපහසු තාවය මගහැර දෙන්න කියලා තමයි කියන්නේ

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු නිරෝෂන් මන්ත්‍රීතුමා කියපු කාරණය පිලිබඳව ඉංජිනේරුතුමියගේ අවධානය යොමු කරන්න ඕන බිලියන 4 ක් 6 ක් වගේ ලොකු මුදලක් වැය කරලා තමයි ලුනාව කලපු ව්‍යාපෘතිය කලේ. එතකොට ඒ ඩිසයින් එක කලාම ඒ ලෙවල් වල අපි කරපු එකක් නොවෙයි ඉංජිනේරු කමිටුවක් විසින් කරපු එකක්. ඒ ලෙවස් සම්බන්ධව කියන්න අපි මුකුත් දන්නේ නැහැ. එතනට ගිහිල්ලා ඒ සම්බන්ධව රන්සිරි ගරු මන්ත්‍රීතුමාගෙනුත් අදාල වෙන්නාවූ නිතරම යට වෙන පැති බලලා ඒකට ඔවුන්ගේ පැත්තෙන් ඔවුන්ට කර ගන්න දෙයක් තියෙනවා නම් එහෙම නැත්නම් මේ ලෙවල් වල මොනවා හරි අඩුපාඩු තියෙනවා නම් හැකි ඉක්මනින් මේ කටයුතු කරන්න ඔබතුමිටය ඊලඟ දවස තියෙන්නේ සඳුදා ඒදිනම මේ සම්බන්ධව කටයුතු කරන්න.

<u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, සමාවෙන්න ඔය ඩිසයින් එක කරන කොට අනුර දිසානයක මහත්මයාත් නාලක දිසානායක මහත්මයත් ඒ පිලිබඳව ලොකු අවබෝධයක් තියෙනවා ඒ අයව සම්බන්ධ කර ගත්තා නම් හොදයි.

**03(19)** <u>**මහ නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවින්ද ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, දහවල් කාලයේ පාසැල් නිමවෙන කොට විශාල වාහන තදබදයක් ඇති වෙන්නාවූ වේල්ස් කුමර විදුහල ඉදිරිපිට මමත් බලාපොරොත්තුවෙන් හිටපු ඔබතුමා විශාල වෙහෙසක් දරලා විවිධ අවස්ථාවන් වල මැදිහත් විමෙන් ඉල්ලිමක් කරන ලද මොරටුවේ පලමුවෙනි මගී මාරුවන උමං මාර්ගය වේල්ස් කුමර විදුහල ඉදිරිපිට මේ වෙනකොට ස්ථාපනය කිරිම සඳහා විවිධ

කැනිම් කටයුතු සිදු වෙනවා. ගරු නගරාධිපතිතුමනි මොරටුවේ සිදුවෙන ඉතාම හොඳ සංවර්ධන කටයුත්තක් එම නිසා මම කැමතියි ගරු නගරාධිපතිතුමනි මේ ගරු සභාවට මේ ඉදිකිරීම් සම්බන්ධව නියෝජිත මහත්වරුන් ගෙන්නලා සභාවත් ඒ සම්බන්ධව දැනුවත් කිරිමෙන් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**03(20)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, ආයාචනා පැමිණිලි යටතේ මීට සතියකට වගේ උඩදි මොරටුවැල්ල දකුණ ප්‍රදේශයේදි පොලීසිය හා ජනතාව අතර ගැටුමක් ඇතිවුනා මම ඒ සිද්ධිය ගැන නොවෙයි කථා කරන්නේ ගරු නගරාධිපතිතුමනි, ඒ ප්‍රදේශයේ ජනතාව කුඩු ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විවිධ අවස්ථාවලදි පැමිණිලි ගණනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. මේ ජනතාව ඉතා දුරිද්‍රතාවයෙන් පෙලෙනවා. ඉදිරිපත් වෙන පැමිණිල්ලක් තමයි ඒ ප්‍රදේශයේ දැඩි ලෙස මත් ද්‍රව්‍ය විකිණීම මත් ද්‍රව්‍ය ජාවරම සිද්ධ වෙන බවට. මේ සම්බන්ධව අපි සභාවේ දි අවස්ථා ගණනාවක් කථා කරලා තියෙනවා. එපමණක් නොවෙයි සංවර්ධන කමිටුවේදි මේ ගැන කථා කරලා තියෙනවා. නමුත් මේ සම්බන්ධයෙන් මේ ව්‍යාපෘතිය නවත්වන්නවත් රජය මැදිහත් වීම හෝ අදාල ආයතනවල මැදිහත් විම නිසි පරිදි සිදු නොවන බවට හැගී යන බැවින් මේ ජනතාවගේ දුරිද්‍රදාවය ඇති වෙලා තියෙනවා. මම ඉල්ලිමක් කරන්න කැමතියි මේ සභාවේ හැකිනම් ඔබතුමාගේ අධීක්ෂනය නායකත්වය යටතේ විශේෂ කමිටුවක් පත් කරලා මේ විශේෂයෙන් මේ ප්‍රදේශයේ මේ මත් ද්‍රව්‍ය ජාවාරම නිසා ළමයින්ගේ අධ්‍යාපනයටත් බාධාවක්. වැඩි කොටසක් අට වසර දක්වා පමණක් අධ්‍යාපනය ලබන්නේ. ඒ නිසා අඩු වයසින් කසාද බදිනවා. ඒවගේම අපයෝජනයට ලක් වෙනවා. මේ සියලු දේවල්ම තියෙනවා ලොකු ප්‍රශ්ණයක් ජනතාව 3000-4000 ක් පමණ ජීවත් වෙනවා මේ වැල්ල ප්‍රදේශයේ. ඔබතුමාගෙන් කාරුණික ඉල්ලිමක් කරනවා මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන්න කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමියට බොහොම ස්තුතියි. අද දිනයේදිත් මේ මොරටුව මහ නගර සභාව සම්පූර්ණ නොමිළයේ අපේ ද සොයිසා ක්‍රීඩාංගනයේ අද සම්මන්ත්‍රණයක් පවත්වනවා වැසිකිලි පිරිසිදු කරලා ජල කරාම අලුත්වැඩියා කරලා ගොඩනැගිල්ල පිරිසිදු කරලා පොලිස් ස්ථාන හතරෙන්ම එකතු වෙලා නියෝජ්‍ය පොලිස් පති වරයෙක් පැමිණිලා අද වැඩසටහනක් කරනවා කියලා කිව්වා මම හිතන්නේ රජයේ අවධානය යොමු කරලා තිබෙන නිසා ඒ කටයුතු කලේ. ඒකට

වැඩි යමක් විදියට ඔබතුමිය ඔය ගෙනාපු යෝජනාව පිලිබඳව අපේ මන්ත්‍රීවරු සියලු දෙනා ඒකට එක පයින් තමන්ගේ ප්‍රතිචාරය දක්වනවා කිසි ප්‍රශ්ණයක් නැහැ. ඒකට අදාල වෙන්නාවූ කාර්ය කිරිමේදි මම හිතනවා ලොකු දායකත්වයක් ලබාදිපු එකක් වෙනවා අපේ සහෝදරයෝ අපේ දරුවෝ අපේ පුත්තු මේකට මැදිහත් වෙලා තියෙනවා. ඒ මැදිහත් වීමේ ප්‍රතිඵලයක් විදියට තමයි ඔය ආරවුලක් ඇති වෙලා තියෙන්නෙත් එම නිසා අපි ඒක ඊලඟ කමිටුවේදි කථා කරමු.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ ලිහිනි මන්ත්‍රීතුමියට ස්තුති වන්ත වෙනවා මේ සිද්ධිය ඇතිවුනේ මගේ බල ප්‍රදේශය තුල මේතන දි මම විශ්වාස කරන්නේ ඔය තත්වය උත්සන්න විමට හේතු වුනේ අද රජය විසින් ගෙනියන අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පය මත සිදුකරන මත්කුඩු වලට ඇබ්බැහි වෙලා සිටින තරුණයින්ව සහ ඒ වලට යොමු වෙච්ච වුන අයව ගෙනියලා මේ වෙනකොට කියලා 50% ක්ම දැන් පුනරුත්ථාපන කඳවුරු ගත කරලා ඒ කටයුතු කරගෙන යනවා. මෙහි කුඩු බොන පිරිස විශාල වශයෙන් විරසක වෙලා ඉන්නවා
පොලිසියත් එක්ක හරි නිවැරදි පොලිස් නිලධාරින් ඔතනට ගියානම් සමහර විට ඔය දේ සිද්ධ නොවෙන්න ඉඩ තිබුනා. සමහර පොලිස් නිලධාරින්

ඉන්නවා ඒ අයගෙන්ම මුදල් අරගෙන හවසට ගිහිල්ලා මොනවා හරි අරන් එන මිනිස්සු ගිහිල්ලා අර මිනිහව ඒ අයව අල්ලගන්න ගියාම එතනදි ඒගොල්ලන්ගේ ක්‍රියා මාර්ගය ගන්නවා. ප්‍රධාන හේතුව වුනේ ඔය පොලිස් නිලධාරින් කිප දෙනෙක් ගියා එගොල්ලෝ එක්ක සම්බන්ධකම් පවත්වගෙන තමන්ගේ සාක්කුවට කියක් හරි දාගන්න අය ගියා. ඒ නිසා තමයි එය ප්‍රශ්ණය ඇති වුනේ. නිසි නිවැරදි නිලධාරියෙක් ගියානම් ඕක වෙන්නේ නැහැ. කොහොම වුනත් අපි ඒක අනුමත කරන්නේ නැහැ. කෙසේ වෙතත් නිවැරදි පුද්ගලයෝ කිප දෙනෙකුත් මේ පොලිසියට ගෙනියල මේගොල්ලන්ටත් ගහලා සමහර අයගේ ත්‍රිවිල් එක පවා පොඩි කරලා තිබුනා. ඒ නිවැරදි පුද්ගලයන්ව අපි අවශ්‍ය තැන් වලට කථා කරලා නියෝජ්‍ය පොලිස්පතිතුමාට පවා මම පුද්ගලිකව කථා කරලා ඒ අයව අපි මුදා ගත්තා ඒ අයට අපි දඩුවම් නොදි ඒ කටයුතු ටික අපි කලා. ඒක මම සඳහන් කරනවා. වැඩිදුරටත් මම මන්ත්‍රිතුමියට සඳහන් කරන්නේ දැන් නගරාධිපතිතුමා සඳහන් කලා වගේ රට පුරාම ක්‍රියාත්මක කරනවා මේවට ඇබ්බැහි වුන තරුණ/තරුණියන් සහා ඒ ඇබ්බැහිවුන අයව නිවැරදි මගට ගන්නට රජයේ වැඩ පිලිවෙලක් මේ වෙනකොට සිදු වෙනවා කියන එකත් මම වැඩිදුරටත් සඳහන් කරනවා.

**03(21) <u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම මොරටුව වෙලෝනා ඉඩමේ අපේ සභාව සතු ඉඩම මේ වෙනකොට කුණු කසල දාලා විශාල අපකීර්ති තත්වයට පත් වෙලා තියෙනවා. ඒ ප්‍රදේශයෙන් නිවසක් ඉඩමක් ලබාගන්නේ මිනිස්සු ඒ අයට හොඳට ජීවත් වෙන්න අවශ්‍ය නිසා. ඒ පිලිබඳව මම කොමසාරිස්තුමා දැනුවත් කලා. ඒ ගත්ත ක්‍රියාමාර්ගය පිලිබඳව එතුමන්ලා අපට පෙර පසු දැනුම් දීමක් කවදාවත් සිද්ද වෙන්නේ නැහැ. ඒ අඩුව ඔබතුමන්ලා අතර තියෙනවා. ඒක ඉදිරියේදි නිවැරදි කර ගන්න. මොකද මේ පොදුජන එක්සත් පෙරමුණේ බලය ජනතා පරමාධිපත්‍ය තේරුම් අරගෙන කටයුතු කරන්න ඔබතුමාට අමුතුවෙන් කියන්න අවශ්‍ය වෙන්නේ නැහැයි කියලා නිලධාරින්ට මම කියනවා. මොකද මම දන්නවා මේ මන්ත්‍රිවර් තමන් කරන යම්කිසි පැමිණිල්ලක් ඒකට පෙරලා අනිත් පැත්තට ගන්න ක්‍රියාමාර්ගය දැනුවත් නැහැ. ඒ මන්ත්‍රිවරයාගේ තියෙන ගෞරවය මොකක්ද. මේ අපි දරන මන්ත්‍රිධුර බලය පිහිටන්නේ ජනතා පරමාධිපත්‍ය මෙතනට එන්නේ ඒකට වැඩි දායකත්වයක් දක්වන විශාල මන්ත්‍රිරු සංඛ්‍යාවක් මෙතන ඉන්නවා. ඒ වගේම ඒකට තවත් විශාල වූ දායකත්වයක් දරලා තමයි මෙතනට ඇවිල්ලා තියෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා නිලධාරින් වශයෙන් අපි කොයි වෙලාවෙත් වැරදිම කියලා ඔබතුමන්ලාව අපහසුතාවයන් වලට පත් කරන්නේ නැහැ. ඒ නිසා ගත්ත ක්‍රියාමාර්ගය පිලිබඳව දැනුවත් කිරිමක් කරන්න. ඒ ජනතාව අපිට කථා කරනකොට අපි උත්තර දෙන්න දන්නේ නැහැනේ. ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද කියලා අපි නැවත අහන්න ඕන. ගරු නගරාධිපතිතුමනි ඒ ගරුත්වය මන්ත්‍රිවරයාගේ ඇති වෙන තත්වයක් ඇති කරන්න. පෙර කාලයේ මන්ත්‍රිවරුන්ට ඒ ගරුත්වය තිබුනා දැන් ඒක ටික ටික ගිලිහිගෙන යනවා. ඒ නිසා ඒ පිලිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලිමක් කරනවා.

**03(22) <u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම සුදු ඔට්ටු කරන තැන්වලින් කුණු ටික ගන්නේ නැහැ කියලා ප්‍රශ්ණයක් තියෙනවා. ඔබතුමා යෝජනාවක් ගෙනාවා එක හොඳ යෝජනාවක් කියලා අපි අනුමත කරනවා. නමුත් මේකෙන් සිද්ද වෙන්නේ මේ කුණු ටික කොහෙන් හරි අපේ පාරකට හෝ එනවා. එකම දේ වෙලා තියෙන්නේ සභාවට කියක් හරි එනවා නම් ඒකයි නැතිවෙලා තියෙන්නේ. ඒ සුදු ඔට්ටු අල්ලන එක යම්කිසි දවසක නතර කරනකම් හරි ඒ කුණුටික ගන්න. ඒ මුදලක් අයකරගෙන හරි සභාවෙන් හරි කරන්න කියන ඉල්ලිමත් කරනවා.

**03(23) <u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට සැප්තැම්බර් මාසෙන් පසුව වෙරළ බාදනය වීම බොහො දුරට නැවතිලා වාරකන් කාලේ ඇති වෙන කාලේ තමයි මේ වෙනකොට. අද වෙනකොට කොරළවැල්ල පොල්වත්ත සීමාවට මෙහායින් නිවාස කීපයකට හානි සිද්ධ වෙලා. එක නිවසක් සම්පූර්ණයෙන්ම ගිහිල්ලා තියෙනවා. තව නිවෙස් කිපයක් බාගයක් ගිහිල්ලා වෙරළ බාදනය විම විශාල ප්‍රශ්ණයක් තියෙනවා. අපිට ඒක සභාවක් වශයෙන් කරන්න දෙයක් නැති වුනත් අපි ඒකට දේශපාලන වශයෙන් අවශ්‍ය අමාත්‍යවරයා දැනුවත් කරලා ඒවගේම පුද්ගලික ආයතන දැනුවත් කරලා අපේ උදව් ප්‍රමාණයක් අපේ මට්ටමෙන් කරගෙන යනවා. නමුත් මේ අයට වාර්ශිකව වාරකන් කාලෙට මේක සිදු වෙනවානේ.ඒ නිසා ඒ අයට මොනවා හරි විසඳුමක් උස්වත්ත ප්‍රදේශයේ ගල් වැටිය දැම්මා වගේ ඒකට ඔබතුමත් මැදිහත් වෙලා ඒ අයට යම්කිසි ඒ හානියට පත් නොවන ආකාරයට වැඩ පිලිවෙලක් කරන්න කියා ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ සහයෝගය දිල අවශ්‍ය තැන් දැනුවත් කරලා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මම කථා කලා ඒගොල්ලෝ වැලි කොට්ට ටිකක් ලබා දෙන්නම් කියලා කිවුවා. නමුත් ස්ථිර වැඩ විසඳුමකට යන්න අවශ්‍ය කටයුතු කරමු කියන ඉල්ලිමත් කරනවා. මේ වෙනකොට අපි ඒ අයට වියලි සලාක ටිකක් දෙන්න ලෑස්ති කරලා තියෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියන ඉල්ලිමත් කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා , රේස්බයි රේස් වලින් නම් අපිට පුලුවන් කමක් නැහැ. කුණුටික දාන එක වලක්වාලීමට අවශ්‍ය කරන කටයුතුත් ඒගොල්ලන්ගේ ලංකාවේ තව රේස්බයි රේස් මොරටුවේ විතරක් නොවෙයි තියෙන්නේ. තව රේස්බයි රේස් තියෙන තැන් ඕන තරම් තියෙනවා ඒ වෙළඳ බලපත්‍ර ලබාගත් ආයතන වලට ගිහිල්ලා හරි ඒගොල්ලන්ට ඒ පැත්තෙන් ඇදගන්න කියන එක හරි ඇරෙන්න රේස් බයි අපි විශේෂයෙන්ම මම හිතනවා ලිහිනි මන්ත්‍රීතුමිය කියපු අපි කවුරුත් බලාපොරොත්තු වන ඔය කුඩු වලට ඇබ්බැහි වුනාම ආර්ථිකය නැති වෙනවා කියන එක කුඩු වලට ඇබ්බැහි වුනාම වැඩිම වුනොත් පැකට් 1 1/2 කට රු.600/- ක් 700/- ක් වැඩිම වුනත් රු.1000/- ක් 1500/- ක් විතර යයි. නමුත් මම දන්නා තරමින් රේස් වලට ගියාම හැම සෙනසුරාදාම ගෙදර නෝනා බලාගෙන ඉන්නවා සෙනසුරාදා බඩු ටික දාලා පඩි ටික එනකම් නමුත් ඔක්කොම ටික තියෙන්නේ රේස් බයි රේස් එක ඇතුලේ. මේකේ ව්‍යාපාරික අයගෙන් සල්ලි අරගෙන අපි කරන්න යන කාර්යභාරය කරන්න බැහැ. ඒ නිසා මේකෙන් ගනන් බැලුවොත් උපරිම වශයෙන් ලක්ෂ 1 ½ - 2 අපිට හම්බවෙන්න තියෙන්නේ. හැබැයි ඒක ඔවුන්ට

පුලුවන් අපි ගන්නේ නැත්තනම් වෙන තැනකට ගිහිල්ලා හරි කුණු ටික දිල ඒ ගොල්ලන්ගේ ඒ මුදල් අයකර ගත්ත අයගෙන් ඒක කර ගන්න පුලුවන් ඒ දැනුම් දිම අපි කරනවා. මම මේක නොකර ඉන්නේ මුකුත් නිසා නොවෙයි අපිට උවමනාවක් තියෙනවා මේ සභාවෙන් මේ වගේ බදු මුදල් වලින් මේ සභාවේ උන්නතිය වෙනුවෙන් කටයුත් නොකරන්නත් මොකද අරක්කු බෝතලයක් බොන කෙනෙකුට උපරිම 1500/- ක් 2000/- ක් යයි. නමුත් මම දන්න කාරණයක් තමයි මම හැමතිස්සෙම ආදේශ කර ගන්නවා මේ නම නන්දන කියන ගස් කපන කෙනා අපේ කොට්ටම්බා ගහක් තිබුනා සුසානභූමියේ ඒ ගහ අවදානම් නිසා අපි කිවුවා එයාට ගපා ගන්න කියලා හැබැයි කපනවට සල්ලි දෙන්නේ නැහැ ගහ අරගෙන යන්න කියලා. බලනකොට කොට්ටම්බා ගහේ වටිනාකම රු. 80000/- ක්. ඒ ගහ විකුණලා නන්දන එදාට පහුවෙනිදා එනවා ඒ වෙලාවේ නන්දන රු.80000/- ම රේස්බයි රේස් වලට පැරදිලා නන්දනට බස් එකේ යන්නවත් සල්ලි නැතුව මම ගෙදරට ගිහිල්ලා බැස්සුවා. ඒ වගේම මහා අපරාධ ගොඩක් වෙනවා. අපි හිතනවා කුඩු වලින් අරක්කු වලින් කසිප්පු වලින් විතරයි කියලා නැහැ මේක බරපතලම දේ වෙන්නේ රේස් බයි රේස් එක ඇතුලේ ඒ නිසා ඒකට අපි වැට කපන්න ඔබතුමාගේ අවධානය යොමු කිරිම සභාවට ආදායම ලැබෙන එක පිලිබදවයි කුණු සම්බන්ධව ඔබතුමා දක්වපු අදහස සියයට දහස්වාරයක් මම ඒ සම්බන්ධයෙන් අවනත වෙනවා. අපි ඒ අයගේ කුණු ගෙනියන්න වැඩ සටහනක් වෙන විදියට ඒගොල්ලන්ගේ මටටමින් එහා පැත්තෙන් ගෙනියලා මොකක් හරි කරමු. ඔබතුමාට බොහොම ස්තුතියි.

**03(24)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මට ඉල්ලිමක් ඉදිරිපත් කරන්න තියෙනවා ඒක 2012, 2014, 2020 යන වර්ෂවල සිට කරපු ඉල්ලිමක්. පහල ඉදිබැද්දේ 57/2 පදිංචි පියල් සාගර මහත්මයාගේ ඉඩම මැද්දෙන් යන කාණු පද්ධතිය මේක කර්මාන්ත අංශයට වෙනකම් ගියා ඇස්තමේන්තුවත් හැදුවා නමුත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ මේක අපි ඉතාමත්ම අනුකම්පාවෙන් බැලිය යුතු කාරණයක්. ඉදිබැද්ද ප්‍රධාන කාණු හතරත් ඒ කාණු වලට යන්නේ. මම ඒක තිලකසිරි මන්ත්‍රීතුමාටත් කිවුවා. නමුත් මේකෙදි භාගයක් හදලා තියෙන්නේ ඉතුරු භාගය තමයි අවශ්‍ය. මම හිතනවා අපි කාගෙත් පාය පක්ෂ භේදයක් නැතුව මේ අයවැයෙන් හරි මුදල් වෙන්කරලා මේක කරනවා නම් ඉතාමත්ම හොඳ ක්‍රියාවක් වෙන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය,අපේ මන්ත්‍රීතුමා ඒකට මුදල් වෙන් කරලා තියෙන්නේ මේ දිනවල අමුද්‍රව්‍ය වල පොඩි ප්‍රශ්ණයක් තියෙනවා

**03(25)** මහ නගර සභා මන්ත්‍රී - එම්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය

ගරු නගරාධිපතිතුමා, එහෙම කරලා තියෙනවානම් බොහෝම හොඳයි. ඒක ක්‍රියාත්මක කරලා ඉවර වුන දවසට මමත් සතුටු වෙන්නම් මමත් ඒ ගැන සොයා බලපු නිසා. අනිත් එක ඉහල ඉදිබැද්ද සහිරා හෝටලය ළඟ තිබෙන ලොකු කාණුව නගර සභාවෙන් හදපු එකක් මම කීප විටක්ම මේක ගැන අදහස් ප්‍රකාශ කලා ඉල්ලීම් කලා අතර මැද කැඩිලා තිබෙන බැමි වලින් අපද්‍රව්‍ය ගලාගෙන එනවා මඩු වලට, ගෙවල් මිදුල් වලට දුර්ගන්දය හමනවා මට ලැබුනා ඔබතුමාටත් පාසැල් දැරියක් විසින් මෙහි තිබෙන අපහසුතාවය දන්වලා එවපු ලිපියක් මම කියන්නේ කර්මාන්ත අංශයෙන් ඇස්තමේන්තුවක් හදලා තියෙනවා නමුත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔබතුමාට මතක් කර සිටිනවා.මෙය ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමා, ඔය කාණු දෙකට අමතරව ඔබතුමාගේ අවධානය යොමු කරනවා අපි දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ සිදු වෙනවා කාණු හදනකොට භූගත කාණු හදනවා ගෙවල්වලට කියනවා අප ද්‍රව්‍ය දාන්න බට දාන්න කියලා ඒ අය රාත්‍රියට මනුෂ්‍ය වාසයට නුසුදුසු ඒවා පවා යවනවා. ඒවගේ කාණු තුනක් ගැන මට ඇවිල්ලා තියෙනවා මම හිතුවා ඒක පොදු ප්‍රශ්ණයක් විදියට ඔබතුමා වෙත ඉදිරිපත් කරනවා.

## 04. ප්‍රශ්ණ - නැත

## 05. යෝජනා - නැත

## 06. 2021 ඔක්තෝම්බර් මස ස්ථාවර කමිටු වාර්තා සලකා බැලීම.

06(1) 2021.10.11 දින පැවති ආයතන හා නිතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාව සළකා බැලිම.

මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය

ගරු නගරාධිපතිතුමා, අයවැය වාර්තාවේ 13 වන පිටුවේ 3.3 ඇ . යටතේ 2014 නොවැම්බර් 12 දිනැති 25 2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ස්ථිර

පත්වීම් ලබාදුන් සේවකයන් 112 ක් 2020.12.31 දින විටත් සභාවේ අනුමත කාර්්ය මන්ඩලයට ඇතුලත් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුල මෙම සේවකයින් සඳහා වැටුප් හා දිමනා වශයෙන් මිලියන 46 හාරලක්ෂ තිස්පන්දාස දෙසියක් ගෙවාතිබුනි. මෙම සේවකයින් අනුමත කාර්්ය මණ්ඩලයට ඇතු්ලත් නොවීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනිමට නොහැකි වි තිබුනි. ඔබතුමා ඔය කියපු කථාවයි මේවා වල සඳහන් වන ඒවයි පරස්පරයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රතුමිය,ඔන්න උගත් නෝනා කලබල වෙලා නා ගන්නවා. ඔය කියන්නේ ලංකාවේ කාඩර් එකට ඇතුලත් කර ගත්ත නැති එක. රවිනාත් මන්ත්‍රතුමා පංතියක් දාන්න.උගත් කම තිබුනට මදි අවබෝධය නැත බිංදුවයි. මන්ත්‍රතුමිය කියන එක විගණනය වෙලා තියෙනනේ අපි චක්‍රලේඛණය අනුව ස්ථිර කරපු අයව කාඩර් එකට ඇතුලත් කරගෙන නැහැයි කියලා. අපේ කාඩර් එකක් නොවෙයි.කාඩර් එක හදන්නේ කාඩර් කමිෂන් එක.කාඩර් එකේ කොමිෂන් එකේ ජොබ් එක තමයි වෙලා නැත්තේ කියලා කියන්නේ. අපේ එක හරි. එකේ තිබුනානම් කාඩර් එකට ඇතුලත් කරලා තියෙන විධිවිධාන වැරදියි කියලා නම් අපේ වරදක්. අපි නිවැරදිව කරලා තියෙන්නේ.

2021.10.11 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01. නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා
02. නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
07. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
08. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
09. මහා නගර සභා මන්ත්‍රී - යු.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය

12. මහා නගර සභා මන්ත්‍රී - පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
26. මහා නගර සභා මන්ත්‍රී - උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය

2021.10.11 දින පැවති ආයතන හා නිතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 05කරුණට විරුද්ධවත් අනෙකුත් සියළුම කමිටු තීරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිනී පිරිස් මහතා

06. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ජ්.දෝන දිලාශිනී මහත්මිය

07. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා

08. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා

09. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය

10. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

11. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය

13. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය

2021.10.11 දින පැවති ආයතන හා නිතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(මේ අවස්ථාවේදී මහා නගර සභා මන්ත්‍රී ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු, එම්.සුනිල් නන්දසිරි, යූ.එල්.සේනක දමයන්ත සිල්වා යන මහත්වරු සභා ගැබෙහි නොසිටියහ.

තවද, ගරු නගරාධිපතිතුමාගේ නියමය පරිදි නියමිත ආසනයේ අසුන් නොගැනීම මත ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මහා නගර සභා මන්ත්‍රී ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ, ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර, ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු යන මහතුන්ගේ ඡන්දය සටහන් නොකරන ලදි.)

06(2) 2021.10.12 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාව සළකා බැලිම.

2021.10.12 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණයන් ඒකමතිකව සභා සම්මත විය.

06(3) 2021.10.12 දින පැවති මහජන උපයෝගිතාව හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාව සළකා බැලිම.

2021.10.12 දින පැවති මහජන උපයෝගිතාව හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණයන් ඒකමතිකව සභා සම්මත විය.

06(4) 2021.10.13 දින පැවති පරිසර සෞඛ්‍ය සනීපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාව සලකා බැලීම.

2021.10.13 දින පැවති පරිසර සෞඛ්‍ය සනීපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණයන් ඒකමතිකව සභා සම්මත විය.

06(5) 2021.10.13 දින පැවති ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබද ස්ථාවර කමිටු වාර්තාව සලකා බැලීම.

2021.10.13 දින පැවති ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණයන් ඒකමතිකව සභා සම්මත විය.

06(6) 2021.10.14 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබද ස්ථාවර කමිටු වාර්තාව සලකා බැලීම.

<u>මහ නගර සභා මන්ත්‍රි - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, කර්මාන්ත කමිටුවේ යෝජනා 3 ක් තියෙනවා. ඒවායේ දින බැලුවොත් 2018.05.03, 2019.07.04 තියෙනවා මේවා හැකි පමනින් ක්‍රියා කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

2021.10.14 දින පැවති කර්මාන්ත පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණයන් ඒකමතිකව සභා සම්මත විය.

06(7) 2021.10.14 දින පැවති ව්‍යාපාති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබද ස්ථාවර කමිටු වාර්තාව සලකා බැලීම.

<u>මහ නගර සභා මන්ත්‍රි - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා , වාර්තාවේ 2(1) සුරංග මන්ත්‍රිතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා වඩු උපකරණය සම්බන්ධව පාසැල් දරුවන්ට දැනුමක් ලබා ගැනිම සඳහා කෞතුකාගාරයක් හදන්න කියලා ඒක සාධනීය යෝජනාවක් ඒක හදලා මොරටුවට පමණක් සිම කරන්නේ නැතුව සංචාරකයෝ ගෙන්වා ගැනිමට වගේ ඉන් ඔබ්බට අරගෙන යන්න කියලා යෝජනා කරනවා ඒ වගේම මොරටුව ඉතිහාසය පිළිබද කරුණුත් සඳහන් වෙන්න පුලුවන් නම් හොඳයි ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය, මෙම කරුණු ක්‍රියාත්මක කිරිම සඳහා ජනසෙත මේ වෙනකොට නවීකරණය කරමින් තියෙනවා.

මේ අවස්ථාවේ දී එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මහා නගර සභා මන්ත්‍රීවරු අංක 03 කරුණට නිහඩතාවයත් අනෙකුත් සියළු කමිටු තීරණයන්ට එකඟතාවය ළලකරන ලදී.

2021.10.14 දින පැවති ව්‍යාපාති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබද ස්ථාවර කමිටු වාර්තාව සියළුම කමිටු තීරණයන් ඒකමතිකව සභා සම්මත විය.

06(8) 2021.10.15 දින පැවති ඵලදායීතාවය හා මුදල් උත්පාදනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාව සලකා බැලිම.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා , 2(5) යෝජනාව ඉතා සාධනිය යෝජනාවක් ඒකට සභාවේ අවධානය යොමු කරන්න කැමතියි. මොරටුව මහ නගර සභාවේ ඵලදායීතාවය ඉහල නැංවිම සම්බන්ධයෙන් 2021.02.23 දින පැවැති සමුලුවක් මත යෝජනා කරනවා කාර්යාලය තුල වැඩ පියවර මොරටුව නගර සභාවේ දත්ත පද්ධතිය, අභ්‍යන්තර විගණනය, මේ සියලුම දේවල් කොහොමද කාර්්යක්ෂම කරන්නේ කියලා මේකේ සාධනිය යෝජනාවල් ගණනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. අපි දැක්කා පහුගිය ඔඩිට් රිපෝට් සාකච්ඡාවේදි මොරටුව මහ නගර සභාවේ තිබුන ප්‍රශ්ණ ගොඩක් සාකච්ඡා වුනා. කාර්්යක්ෂම ලෙස ලේඛන පවත්වා නොගැනිම, ඒ දත්ත මැකීයාම් ආදි සියලු දේවල් ගැන සාකච්ඡා වුනා. ඔබතුමාගේ රජයක් හැටියට ඔබතුමාගේ ජනාධිපතිවරයාගේ සෞභාග්‍ය දැක්මේ තිබුන එකක් තමයි කොහොමද ඩිජිටල් තාක්ෂණය ගෙනල්ල ලංකාව තුල සුරක්ෂිත භාවට ඇති කරලා කොහොමද කාර්යක්ෂම දේවල් කරන්නේ කියලා. අපි 2021 වරෂය ගත්තම මොරටුව මහ නගර සභාවේ සිදුවන කටයුතු වලත් ටෙක්නොලොජි විදියට භාවිතා කරලා කොහොමද ක්‍රියාත්මක කරන්නේ කියලා. මේ වාර්ථාවේ තියෙන්නේ සාධනීය දේවල් ක්‍රියාත්මක කරන්නේ කවදද මේවා විධිමත්ව කෙරෙනවද මේවාට දින කාල රාමුවක් තියෙනවද මම ඔබතුමාගෙන් අහන්න කැමතියි මේකට ප්‍රමුඛතාවය දෙන්න කියලා මම ඉල්ලිමක් කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය,මේ සියලුම යෝජනාවල ක්‍රියාවලිය මගේ ප්‍රධානත්වයෙන් ඉදිරියේදි ක්‍රියාත්මක කිරිමට කටයුතු කරනවා.

2021.10.15 දින පැවති ඵලදායීතාවය හා මුදල් උත්පාදනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කරුණු ඒකමතිකව සභා සම්මත විය.

06(9) 2021.10.15 දින පැවති මුදල් පිළිබද ස්ථාවර කමිටු වාර්තාව සලකා බැලිම

<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජේ ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමා ,මුදල් කමිටු වාර්තාවේ 11,12,12(1),12(2),13,15(1),15(2),17,19,20 සහ 22 අපි විරුද්ධයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා , 9(3) සම්බන්ධයෙන් 9(3) ඇමුණුම කියලා සඳහන් වුනාට වාර්තාවට ඇතුලත් වෙලා නැහැ.ඇතුලත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.ඇමුණුම 5 සඳහන් වන වෙළඳ බලපත්‍රයට ෆෝමැට් එකට යම්කිසි සංශෝධනයක් කිරීමේ හැකියාවක් තියෙනවද ඉල්ලීමක් කරන්න කැමතියි. මම යෝජනා කරන්න කැමතියි වෙළඳ බලපත්‍ර දෙනකොට වර්ග අඩි ් ප්‍රමාණය ඇතුලත් කරන්න කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, එතන වර්ග අඩි ප්‍රමාණය ඇතුලත් වෙනවානේ ඉබේම. වර්ග අඩි ප්‍රමාණයත් එක්කම තක්සේරුව හැදෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා ,සමහර වෙලාවට එකකට තමයි අනුමැතිය දෙන්නේ. කඩේට ගියාම එක වෙන ප්‍රමාණයක්. ඒක තමයි නීතිය.මේකට ඉල්ලීමක් කරන්න කැමතියි. ඔබතුමා සලකා බලන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ජනතාව අමාරුවේ දාන්න බැහැ මේ වෙලාවේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, අංක 17 ඇමුණුම 10 අයවැයේදි සාකච්ජා කරලා ඔබතුමාට මම සංශෝධන කිපයක් ඉදිරිපත් කලා. කාන්තාවන් සහ දරුවන් සම්බන්ධයෙන් යම් කිසි මුදලක් ඇතුලත් කරන්න කියලා. ඒක මෙතන සඳහන් වෙන්නේ නැහැ ඔබතුමා කලාද කියලා දැනගන්න කැමතියි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, බජට එකට ඇතුලත් කරලා තියෙනවා.

2021.10.15 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළු කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01. නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා
02. නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
07. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
08. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
09. මහා නගර සභා මන්ත්‍රී - යු.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය

26. මහා නගර සභා මන්ත්‍රී - උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය

2021.10.15 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක11,12,12(1),12(2),13,15(1), 15(2),17,19,20 සහ 22 යන කරුණු වලට විරුද්ධවත් අනෙකුත් සියළුම කමිටු තීරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිනී පීරිස් මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය
07. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
08. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා
09. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය

2021.10.15 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(මේ අවස්ථාවේදී මහා නගර සභා මන්ත්‍රී ඩබ.මැක්සි ජේ ප්‍රනාන්දු, එම්.සුනිල් නන්දසිරි, යූ.එල්.සේනක දමයන්ත සිල්වා යන මහත්වරු සභා ගැබෙහි නොසිටියහ.

තවද, ගරු නගරාධිපතිතුමාගේ නියමය පරිදි නියමිත ආසනයේ අසුන් නොගැනීම මත ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මහා නගර සභා මන්ත්‍රී ඩබ්.පී. ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ, ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර, ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු යන මහතුන්ගේ ඡන්දය සටහන් නොකරන ලදි.)

**06(10) 2021.10.15 දිනැති ඉඩම් හා නගර සංවර්ධන/මහජන උපයෝගිතාවය හා ප්‍රජා සංවර්ධනය/ආයතන හා නීතිය/පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව/ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු/ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය/ඵලදායිතාවය හා මුදල් උත්පාදනය/කර්මාන්ත හා ඉදිකිරීම්/මුදල් පිළිබද වූ ඒකාබද්ධ ස්ථාවර කමිටුවේ වාර්තාව සළකා බැලීම.**

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා විශේෂ කැඳවීමක් කරලා ඒකාබද්ධ කාරක සභා රැස්වීමක් පැවැත්තුවා ගිය 15 වෙනිදා. එහිදි අපි අපේ අදහස් ප්‍රකාශ කලා ඔබතුමාට අපෙන් ලැබිය යුතු යම්කිසි සාධණිය සහයෝගයක් අවශ්‍ය නම් ඒ පිළිබඳවත් අපි ඔබතුමාව දැනුවත් කලා. ප්‍රධාන දේ එයට අදාල වාර්තාව මන්ත්‍රීවරුන්ගේ ප්‍රකාශන ටික ඇතුලත් වෙලා නැහැ. අදහස් ප්‍රකාශ කලා මම, නිරෝෂන් අපොන්සු, ලිහිනි ප්‍රනාන්දු, මසීනා බක්කර්, නිශාන්ත ප්‍රදිනාන්දු යන මහත්ම/මහත්මීන් මට මතක විදියට මේ ප්‍රකාශන ටික හැන්සාඩ් වුනානම්

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රතුමා, ඔබතුමාට බාධා කරනවා නොවෙයි. අපි සාකච්ජා වාර්තාවකට භාජනය කලා සාකච්ජා වාර්තාව විගණන විමසුම් වලදි කාරණා විදියට දක්වන්න බැහැ. හැබැයි හොඳ සාධනීය තැනකට ආවා. පුලුවන් නම් විගණන විමසුම් කරන එකේදි සම්පූර්ණයෙන්ම ඒ කටයුතු සඳහා උත්තර ලිවීමේදි මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබාගෙන උත්තර ලියන එක සාධනිය තත්වයක්. ඒ ඇරෙන්න විගණන විමසුම් කරාට පස්සේ මන්ත්‍රීවරුන්ගේ අදහස් විගණන විමසුමට ඒක කරන්න පුලුවන් එකක් නොවෙයි. ඒක නීතියටත් පටහැනියි. ඒක කරන්න පුලුවන් එකක් නොවෙයි. නමුත් උත්තර ලිවීමේදි උත්තර පිලිබඳව සාකච්ජා කරමු.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපිව ඒ වගේ විශේෂ රැස්වීමකට කැඳවීමේ ප්‍රතිපලය මොකක්ද අපේ.අපි කරන ලද ප්‍රකාශන එළි දක්වන්නේ නැත්නම් එතන ලොකු අඩුවක් හැටියට අපි දකිනවා ගරු නගරාධිපතිතුමනි.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපි ඒකාබද්ද කාරක සභාවකින් අදහස් කරන්නේ නිවැරදි දිශාවකට යාම සඳහා අවශ්‍ය වන්නාවූ මහ පෙන්වා ගැනීමකට විතරයි. උදාහරණයක් කිව්වොත් පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායිකව කමිටු පවත්වනවා. කාරක සභාවල් පවත්වනවා.අපිත් ඒකාබද්ධ කාරක සභා පවත්වනවා ඒකාබද්ධ කාරක සභාවල් පැවැත්වීමෙදි මන්ත්‍රීවරයා ගේන අදහස අනුව මුදල් වෙන් කිරිම නොවෙයි කරන්නේ මුදල් වෙන් කරලා තියෙන එකේ යම් කිසි දෝෂයක් තියෙනවා නම් දෝෂ නිවැරදි කර ගැනිම ඒ අදහස බජට් එකට දානවා කියන එක නොවෙයි ඒකෙන් අදහස් කරන්නේ.ඒ වගේ විගණනයේදි විගණනයට ලක් වෙන්නාවූ තොරතුරු පිලිබිදව සාකච්ජා කරලා ඊලගට විගණනයට හවු නොවන විදියට කටයුතු කිරිම මිසක් ඒකාබද්ද කාරක සභාවෙන් වෙන්නේ විගණනයට පිලිතුරු සැපයිම මේකෙන් වෙන්නේ නැහැ.ඒක කරන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානියා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඒ ගැන කිසිදු විවාදයක් නැහැ. මම කියන්නේ සභාවක් පැවැත්වුවාම ඒ වාර්තාවක් අපි ලඟ තියෙනවා. ඒ වගේ මේ වාරථාවක් මන්ත්‍රීවරු හැටියට අපිට ලබාදුන්නා නම් බොහොම සාධාරණයි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, ඔබතුමාගේ පැහැදිලි කිරිමක් මේ කරුන.සාමාන්‍යයෙන් සම්ප්‍රදානුකුලව ඒකාබද්ධ කාරක සභා තිබ්බම ඒක හැන්සාඩ් ගත නොකිරිම මේ විගණන වාර්තාවේ අපි ඉදිරිපත් කරපු අදහස් පිළිබදව.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය,නැහැ ඒක කරන්නේ නැහැ.බජට් එකට වඩා පහලින් තියෙන්නේ. මොරටුව මහ නගර සබාවේ හෝ පලාත් පාලන ආයතනයක

ප්‍රධාන ලියවිල්ල අයවැය ලේඛණ ලියවිල්ල. ඒකට වඩා පහලින් ඔය සියලු දේ තියෙන්නේ.

<u>**මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා,ඔබතුමාගෙන් ප්‍රශ්ණයක් අහන්න කැමතියි.අපි විගණන වාර්තාව එදා සාකච්ඡා කරලා ඒ සම්බන්ධයෙන් අපි යෝජනා ඉදිරිපත් කලා. එකේ දිලා තියෙන කරුනු සම්බන්ධයෙන් ඉදිරියට ඔබතුමා නිවැරදි කිරිම සඳහා මොනවා හරි කටයුතු කරනවද කියලා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රිතුමිය,ඒක තමයි කිව්වේ ඒ නිවැරදි කිරිම් ටික කරන්න පුලුවන් වෙන්නේ නිලධාරින් දෙන පිලිතුරු වලින්නේ.පිලිතුරු සාකච්ජා කිරිමට මම අනිත් දවසේදි කමිටු පත් කර ගන්නවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - බි.සජිත් දුමින්ද පිරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මේක අදාල නුනත්, මොරටුව නගර සභාවට අදාල වෙන කසල කලමනාකරණය සම්බන්ධව ඒකාබද්ධ කාරක සභාවක් කමිටුවක් තිබ්බ එකේ යම් ප්‍රවණතාවක් තියෙනවද ඔවුන්ගේ සාධනිය ප්‍රතිචාරයක් අපිට තියෙනවද. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පැත්තෙන්.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රිතුමා, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පැත්තෙන් අපේ ලිපියට පිලිතුරු ලියන්න තරම්වත් ඒගොල්ලන්ට ශක්තියක් නැහැ නීතියක් නැහැ. මේ ණය බොල් ණය කරනවා ඇරෙන්න අපෙන් සල්ලි ගන්න බැහැ. එකම ආයතනයකට නීතිය දෙයාකාරයකින් කටයුතු කරන්න බැහැ. ගිවිසුමක් නැති එකකට නගරාධිපතිවරයාගේ ධුරධාරිත්වය නැති කරන්නත් ගිවිසුමක් නැති එකේ සල්ලි බලෙන් ගැනිමත් කියන දෙක නීතිය දෙපැත්තට කඩන්න බැහැ. ඒ නිසා මෙතන මුදල් ගෙවිමක් වෙන්නේ නැහැ. මින් ඉදිරියේදි එකඟතාවයකට මතු වුනොත් විතරක් ඒ එකඟතාවය අනුව ගිවිසුමක් ඇතිකරගෙන එතනින් එහාට මුදල් ගෙවිම කටයුත්ත සිදු කරනවා.

**2021.10.15 දින පැවති ඉඩම් හා නගර සංවර්ධන/මහජන උපයෝගිතාවය හා ප්‍රජා සංවර්ධනය/ආයතන හා නීතිය/පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව/ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු/ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය/ඵලදායිතාවය හා මුදල් උත්පාදනය/කර්මාන්ත හා ඉදිකිරීම්/මුදල් පිළිබද වූ ඒකාබද්ධ ස්ථාවර කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීවරු එතුමන්ලා බොහෝ වෙලාවට සියලු දේ දන්නා නිසා, සභාවේ කථා කරපු එතුමන්ලා අද ආසන පනවාගෙන තිබුන විදිය සභාවේ පිලිගත් ආසන පැනවිමක් නොවෙයි. එම නිසා ඔවුන් කියපු දේවල් හැන්සාඩ් එකෙන් අයින් කරන්න. ඔවුන් ඡන්දය ලබාදිපු සියලුම දේවල් අයින් කරන්න. එතුමන්ලාගේ ඉන්න ඕනෑ කෙනෙක් ආවේ නැහැ කියලා ඒ ආසනයේ ඉදගන්න එතුමන්ලට පුලුවන් කමක් නැහැ. එම නිසා ඒ සියලුම දේවල් හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න.

## 07. <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව</u> -

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,2021.10.15 මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021 සැප්තැම්බර් මාසයට අදාළ මුල්‍ය වාර්තාව ඇමුණුම - 01 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

## 08. <u>පුද්ගලික ස්වභාවයේ කරුණු</u> - නැත

## 09. <u>වෙනත් කරුණු</u> - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2021.11.05 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය